WWW.OLEVELAPI.COM

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2017

# 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය

## (නව නිර්දේශය)

ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත් වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2017
### 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය (නව නිර්දේශය)
### ලකුණු දීමේ පටිපාටිය

I පත්‍රය - 1 x 40 = ලකුණු 40

II පත්‍රය -

01. ප්‍රශ්නය - 10 x 2 = ලකුණු 20
02. ප්‍රශ්නය - = ලකුණු 25
03. ප්‍රශ්නය - = ලකුණු 10
04. ප්‍රශ්නය - = ලකුණු 10
05. ප්‍රශ්නය - = ලකුණු 15

එකතුව = ලකුණු 80 = ලකුණු 80

III පත්‍රය -

01. ප්‍රශ්නය - 2 x 10 = ලකුණු 20
02. ප්‍රශ්නය - 4 x 5 = ලකුණු 20
03. ප්‍රශ්නය - = ලකුණු 15
04. ප්‍රශ්නය - = ලකුණු 15
05. ප්‍රශ්නය
06. ප්‍රශ්නය
07. ප්‍රශ්නය

(05, 06, 07) එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සැපයිය යුතු යි. = ලකුණු 10

එකතුව = ලකුණු 80 = ලකුණු 80

WWW.OLEVELAPI.COM

### අවසාන ලකුණු ගණනය කිරීම

| | | |
|---|---|---|
| I පත්‍රයට ලකුණු | = | 40 |
| II පත්‍රයට ලකුණු | = | 80 |
| III පත්‍රයට ලකුණු | = | 80 |
| එකතුව | = | 200 |
| අවසාන ලකුණු | = | 200 ÷ 2 |
| | = | 100 |



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

## උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන්ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේ දී **පැහැදිලි ඉලක්කමින්** ලියන්න.
3. ඉලක්කම් ලිවීමේ දී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.
4. එක් එක් ප්‍රශ්නයේ අනුකොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) ..................................................
..................................................
.................................................. √ △ $\frac{4}{5}$

(ii) ..................................................
..................................................
.................................................. √ △ $\frac{3}{5}$

(iii) ..................................................
..................................................
.................................................. √ △ $\frac{3}{5}$

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = □ $\frac{10}{15}$

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

1. ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දක්වෙන කොටුව ද කපා ඉවත් කරන්න. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න. කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන/අතිරේක ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න. **(අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුවෙන් සකසනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.)**
2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවක දී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.
3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර ✕ ලකුණකින් ද වරණ තීරය අවසානයේ ලකුණු කරන්න. නිවැරදි ලකුණු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරය පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න. ලකුණු පරිවර්තනය කළ යුතු අවස්ථාවල දී පරිවර්තිත ලකුණු ලියා ඒ වටා රවුමක් අඳින්න. **උදාහරණ :**

නිවැරදි පිළිතුරු සංඛ්‍යාව $\frac{30}{50}$ ⟶ ලකුණු ($\frac{60}{100}$)



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති කොටස් පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.
2. ලකුණු සටහන් කිරීමේ දී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.
3. කිසියම් අයදුම්කරුවකු විෂයයට නියමිත ප්‍රශ්නපත්‍ර එකකට පමණක් පෙනී සිටි අවස්ථාවක දී (ප්‍රශ්නපත්‍ර තුනක් ඇති විෂයයන් හි එකකට හෝ දෙකකට) ඉතිරි ප්‍රශ්නපත්‍රයට හෝ ප්‍රශ්න පත්‍රවලට ඔහු නොපැමිණි බව විස්තර ලකුණු ලැයිස්තුවේ සටහන්ව තිබේ නම්, නොපැමිණි පත්‍රවලට අයදුම්කරු ලබා ඇති ලකුණු 00 ක් සේ සලකා එම අයදුම්කරුගේ අවසාන ලකුණු තීරණය කළ යුතුය.

**උදාහරණ :** (i) මුළු ලකුණු 100 (ii) මුළු ලකුණු 200

| අවසාන ලකුණු 100 | මුළු ලකුණු 100 | I පත්‍රය 40 | II පත්‍රය 60 |
|---|---|---|---|
| 44 | 44 | AB | 44 |

| අවසාන ලකුණු 100 | මුළු ලකුණු 200 | I පත්‍රය 100 | II පත්‍රය 100 |
|---|---|---|---|
| 31 | 62 | 62 | AB |

4. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියල්ලම ලකුණු කොට ලකුණු මුල් පිටුවේ සටහන්කර අවසානයේ දී ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

5. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ගණන ඔබ විසින් මුල් පිටුවේ එකතු කර ඇති මුළු ගණනට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න. ඒ ඒ ප්‍රශ්න පත්‍රයට ලබා ඇති ලකුණු ප්‍රතිශතයක් වශයෙන් දැක්විය යුතු අවස්ථාවල දී එසේ දක්වන්න. **(ඇතැම් ප්‍රශ්න පත්‍රවලට නියමිත ලකුණු ගණන හා ප්‍රතිශතය සමාන වන අතර, ඇතැම් ඒවායේ නියමිත ලකුණු හා ප්‍රතිශතය වෙනස් වේ.)**

**අවසාන ලකුණු තීරණය කළ නොහැකි අවස්ථා :**

1. කිසියම් විභාග මධ්‍යස්ථානයකට අයත් ඔබ ලකුණු කරන විෂයයේ I හෝ II උත්තරපත්‍ර පැකැට්ටුවලින් එක් පැකැට්ටුවක් ඔබ මණ්ඩලය වෙත ලැබී නොමැති විට.

   **උදාහරණ :**

   ගණිතය විෂයය සඳහා ගණිතය I හා II වශයෙන් ප්‍රශ්න පත්‍ර දෙකක් තිබේ. එහෙත් අංක 10 දරන විභාග මධ්‍යස්ථානයෙන් ඔබ මණ්ඩලය වෙත ලැබී ඇත්තේ ගණිතය II උත්තර පත්‍ර පැකට්ටුව පමණි.

WWW.OLEVELAPI.COM

2. කිසියම් අයදුම්කරුවකුගේ I හෝ II හෝ III හෝ උත්තරපත්‍රවලින් 01 ක් හෝ 02 ක් හෝ පැකැට්ටුව තුළ නොමැති අවස්ථාවක දී, ඔහු එම ප්‍රශ්න පත්‍රයට හෝ පත්‍රවලට නොපැමිණි බව ශාලාධිපති විසින් **විස්තර ලකුණු ලැයිස්තුවේ** සටහන් කර නොමැති විට.

3. කිසියම් අයදුම්කරුවකුගේ උත්තරපත්‍රයේ සඳහන් **විභාග අංකය** හා **ලකුණු ලැයිස්තුවේ** සඳහන් විභාග අංකය නොසැසඳෙන විට.

4. කිසියම් මධ්‍යස්ථානයක සියලු ම අයදුම්කරුවන්ට පොදු වශයෙන් බලපා ඇති වරදක් සිදු වී ඇති විට.

   **උදාහරණ :**

   ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන, කඩදාසි දෙකකින් හෝ කිහිපයකින් සමන්විත ප්‍රශ්න පත්‍රයක් ඇති අවස්ථාවක විභාග අපේක්ෂකයින්ට එක් කඩදාසියක් හෝ කිහිපයක් අඩුවෙන් දී ඇති අවස්ථා



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**මෙවැනි අවස්ථාවලදී,**

1. අවසාන ලකුණු තීරණය නොකර ලකුණු ලැයිස්තුවේ **වෙනත් කරුණු** තීරයේ අයදුම්කරුගේ **විභාග අංකය** ලියා **"අවසාන ලකුණු තීරණය කළ නොහැක"** යන සටහන යොදන්න. මෙම සටහන උත්තරපත්‍රයේ මුල් පිටුවේ පහළ කෙළවරේ ද යොදන්න. මේ පිළිබඳව ජර්නල් සටහනක් ද යොදන්න.

2. අවසන් ලකුණු තීරණය කළ නොහැකි අයදුම්කරුවන් පිළිබඳ තොරතුරු මධ්‍යස්ථාන අනුව වෙන් වෙන් වශයෙන් (9IML) අසම්පූර්ණ ලකුණු ලැයිස්තු පිළියෙල කරන්න. මෙම ලකුණු ලැයිස්තු 9IML කවරය තුළ බහා ඇගයීම් මධ්‍යස්ථාන පරිපාලකට භාර දෙන්න.

**අවසාන ලකුණු තීරණය කිරීම :**

දින පැකැට්ටුවට අදාළ සියලුම උත්තරපත්‍ර එනම් I හා II (ඇත්නම් III) උත්තරපත්‍ර ලකුණු කර අවසාන වූ පසු එම උත්තරපත්‍රවලට අදාළ ලකුණු අයදුම්කරුගේ II පත්‍රයේ මුල් පිටුවේ සටහන් කරන්න.

**උදාහරණ :**

| (අ) | (ආ) | (ඇ) |
|---|---|---|
| (i) $\frac{28}{40}$ | (i) $\frac{22}{40}$ | (i) $\frac{60.5}{100}$ |
| (ii) $\frac{61}{80}$ | (ii) $\frac{34}{60}$ | (ii) $\frac{81}{100}$ |
| (iii) $\frac{66}{80}$ | | |
| 3 \| 155 | | 2 \| 141.5 |
| 51.66 | | 70.75 |
| ප්‍රතිශතය 52% | ප්‍රතිශතය 56% | ප්‍රතිශතය 71% |

ඉහත උදාහරණවලින් දක්වෙන පරිදි දශම සංඛ්‍යා ලැබෙන අවස්ථාවලදී අවසාන ලකුණු පමණක් පූර්ණ සංඛ්‍යාවක් ලෙස දක්වන්න. අවසාන ලකුණු ප්‍රතිශතයක් වශයෙන් පූර්ණ සංඛ්‍යාවක් ලෙස දැක්වීමේ දී ඉතිරිය 0.5 හෝ ඊට වැඩි නම් ඊළඟ පූර්ණ සංඛ්‍යාවට පැමිණවිය යුතුය. ඉතිරිය 0.5ට අඩු නම් නොසලකා හැරිය යුතුය. අවසාන ලකුණු ලෙස සැලකෙන්නේ එක් එක් අයදුම්කරුවන් එම විෂයයේ සෑම ප්‍රශ්න පත්‍රයකටම ලබා ඇති ලකුණුවල ප්‍රතිශතයයි. අවසාන ලකුණු II පත්‍රය මත අකුරින් ද ලියා දක්වන්න.

***



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

WWW.OLEVELAPI.COM



## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
## ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව

## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2017

## අභිමතාර්ථ
## I පත්‍රය

## 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය

මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්න හතළිහකින් සමන්විත වේ. මෙහි දී අපේක්ෂකයින්ගේ අවබෝධය, ස්මරණය, නිරවුල් දැනුම, භාෂා පරිචය හා භාවිතය පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් අපේක්ෂා කෙරේ.

## II පත්‍රය

මෙය ප්‍රශ්න පහකින් සමන්විත වෙයි. 1 ප්‍රශ්නය කෙටි උත්තර අපේක්ෂිත ප්‍රශ්න 10 කින් යුක්ත වෙයි. මෙහි දී සිංහල භාෂාවේ වචන කෝෂය ව්‍යාකරණ ආදිය පිළිබඳ දැනුම අපේක්ෂා කෙරේ. 2 ප්‍රශ්නය රචනා ලිවීමේ හැකියාව මැන බලන්නකි. දී ඇති රචනා මාතෘකා හතරෙන් එකක් යටතේ රචනාවක් ලිවීමත්, යෝග්‍ය මාතෘකාවක් යෙදීමත් අපේක්ෂා කෙරේ. මෙහි දී අපේක්ෂකයාගේ නිර්මාණ හා චින්තන ශක්තිය, ලේඛන කුසලතාව, නිරවුල් භාෂා භාවිතය, සංශ්ලේෂණ හා විශ්ලේෂණ හැකියාව මැන බැලීම ආදි අරමුණු කෙරෙහි අවධානය යොමු වෙයි.

3 ප්‍රශ්නය සාරාංශකරණය යි. දී ඇති ඡේදයක් සංක්ෂේප කොට ලියා දැක්වීම මෙහි දී අපේක්ෂා කෙරේ. අපේක්ෂකයින්ගේ සංශ්ලේෂණ හා විශ්ලේෂණ හැකියාව මෙන්ම භාෂා භාවිතය පිළිබඳ දැනුම ද මෙහිදී පරීක්ෂා කෙරේ.

4 ප්‍රශ්නය අපේක්ෂකයින්ගේ භාෂා ඥානය හා අවබෝධය පරීක්ෂා කෙරෙන්නකි. මේ සඳහා නිර්දිෂ්ට ඡේදයක් ආශ්‍රයෙන් ප්‍රශ්න ඉදිරිපත් කෙරේ. මේ ප්‍රශ්න මනාව අවබෝධ කරගෙන නිවැරදි පිළිතුරු ලිවීම අපේක්ෂිත යි.

5 ප්‍රශ්නයේ දී අපේක්ෂකයින් විවිධ ලේඛන ලිවීමේ දී දක්වන දක්ෂතාව, ප්‍රායෝගික ලේඛන කුසලතාව විමසා බැලේ. මෙහි එක් ප්‍රශ්නයක් වන්නේ අත් පත්‍රිකාවක් සැකසීමයි. එහිම අනෙක් ප්‍රශ්නය වනුයේ වෙළෙඳ දැන්වීමක් සකස් කිරීම යි. මෙබඳු ප්‍රශ්න මගින් නූතන සමාජයෙහි විවිධ ප්‍රායෝගික ලේඛන පිළිබඳ අධ්‍යයනය හා ඒවා සිත්ගන්නා පරිදි ලියා දැක්වීමත් පිළිබඳ අපේක්ෂකයින්ගේ කුසලතාව විමර්ශනය කෙරේ.

WWW.OLEVELAPI.COM

## III පත්‍රය

මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හතකින් සමන්විත වෙයි. 1 ප්‍රශ්නයේ කොටස් දහයකි. මෙහිදී නිර්දිෂ්ට ග්‍රන්ථ පිළිබඳ අපේක්ෂකයින්ගේ අවබෝධය පරීක්ෂා කෙරේ.

2 ප්‍රශ්නය යොමුවන්නේ නිර්දිෂ්ට ග්‍රන්ථවල යෙදූ භාෂාවේ අර්ථාවබෝධය පිළිබඳ අපේක්ෂකයින් සතු දැනුම පරීක්ෂා කිරීමටයි. 3, 4 ප්‍රශ්න නිර්දිෂ්ට ග්‍රන්ථ පිළිබඳ අපේක්ෂකයින්ගේ විශ්ලේෂණාත්මක දැනුම පරීක්ෂා කිරීම සඳහා යොමුවෙයි.

5,6,7 ප්‍රශ්නවලින් අපේක්ෂකයින් පිළිතුරු සැපයිය යුත්තේ එකකට පමණි. මෙහි අභිමතාර්ථය වනුයේ නිර්දිෂ්ට ග්‍රන්ථ ආශ්‍රිතව අපේක්ෂයින් තුළ පවත්නා විශ්ලේෂණාත්මක, විචාරාත්මක හා තර්කානුකූල දැනුම මැන බැලීමයි.

සමස්තයක් වශයෙන් සැලකීමේ දී සිංහල I, II හා III ප්‍රශ්න පත්‍ර අපේක්ෂකයින්ගේ භාෂා ඥානය හා සාහිත්‍යාවබෝධය පරීක්ෂා කිරීම සඳහා යොමු වන බව සඳහන් කළ යුතුය.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved/

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**21 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2017

| | | |
|---|---|---|
| සිංහල භාෂාව හා සාහිත්‍යය | I, II | පැය තුනයි |
| சிங்களமொழியும் இலக்கியமும் | I, II | மூன்று மணித்தியாலம் |
| Sinhala Language and Literature | I, II | Three hours |

## සිංහල භාෂාව හා සාහිත්‍යය I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම ප්‍රශ්නවලට උත්තර සපයන්න.** මෙම ප්‍රශ්න පත්‍රය සඳහා **ලකුණු 40ක්** ලැබේ.
(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** උත්තරය තෝරන්න.
(iii) **ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.**
(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

- අංක **1** සිට **3** තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.

**1.** අයියා **ඇඟිලි ගනිමින් සිටින්නේ** රැකියාවක් ලැබෙන තුරු ය.
(1) නිකම් බලා සිටින්නේ (2) මහත් බලාපොරොත්තුවෙන් සිටින්නේ
(3) දින සති ගෙවමින් සිටින්නේ (4) නිවසට වී කල් යවන්නේ

**2.** වරදක් සිදු කර **කොළේ වහන එක** යහපත් දෙයක් නොවේ.
(1) සඟවාගෙන සිටීම (2) ආපසු හැරී සිටීම
(3) බොරු ප්‍රචාරය කිරීම (4) නොපිළිගෙන සිටීම

**3.** නංගී **තකහනියෙන්** ම ආවේ අම්මාට යමක් කීමට ය.
(1) බියේ ගැහෙමින් (2) සිනාසෙමින්
(3) කෑගසමින් (4) ඉක්මනින්

- අංක **4** සිට **6** තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

**4.** භාෂාවේ පරිණාමය පිළිබඳ කතාව රසවත් ................................. කි.
(1) පර්යේෂණය (2) විමර්ශනය (3) වෘත්තාන්තය (4) සම්මර්ශනය

**5.** 'ශ්‍රී ලංකාවේ ගොන්ඩ්වානා තැන්පතු' නම් ලිපිය පුරාසික පොසිල පිළිබඳ ලියැවී ඇති ශාස්ත්‍රීය ..................... කි.
(1) වාර්තාව (2) මූලාශ්‍රය (3) ප්‍රකාශය (4) ජනප්‍රවාදය

**6.** ලේඛකයාගේ ..................... වී ඇත්තේ සමාජය යහමගට ගැනීමට උපකාර වන පණිවුඩයක් තම කෘතිය මගින් පාඨකයාට ලබාදීමයි.
(1) අභිමානය (2) ප්‍රාර්ථනය (3) සම්ප්‍රදාය (4) අභිප්‍රාය

**7.** අකාරාදි පිළිවෙළ නිවැරදි ව දැක්වෙන පද පෙළිය තෝරන්න.
(1) රත්තරන්, රදාවාන, රාස්සගල, රබාන (2) ඉතාලිය, ඉතියෝපියාව, ඕලන්දය, චීනය
(3) සමාජය, සාහිත්‍යය, හාස්‍යය, චමත්කාරය (4) විදග්ධ, විශේෂ, විශාල, සෞම්නස

**8.** සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පෙළිය තෝරන්න.
(1) ප්‍රකාශන විලාසය, අතීතාවර්ජණය, ප්‍රතිබිම්භය, පෘෂ්ඨීමත්
(2) සුභාසිංසනය, කාව්‍යශේඛරය, අභ්‍යවකාශය, කළමනාකරණය
(3) ධාරාණිපාත, උපාධි ප්‍රදානය, සැලසුම, සාමර්ථ්‍යය
(4) ප්‍රවර්ධනය, ව්‍යවස්ථාව, උත්කෘෂ්ටාලංකාර, පාරිභෝගිකයා



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

9. **යංශය, රකාරාංශය, රේඵය** සහ **ගැට ඇලපිල්ල** අනුපිළිවෙළින් යෙදී ඇති උත්තරය තෝරන්න.
(1) ත්‍යාග, ප්‍රසාද, තර්ක, කෘශ
(2) කෘශ, ප්‍රසාද, තර්ක, ත්‍යාග
(3) තර්ක, කෘශ, ත්‍යාග, ප්‍රසාද
(4) ප්‍රසාද, තර්ක, කෘශ, ත්‍යාග

10. 'තාරපති' යන වචනය අයත් වන්නේ,
(1) විශේෂණ සමාසයට ය.
(2) ද්කාරාර්ථ සමාසයට ය.
(3) අන්‍යාර්ථ සමාසයට ය.
(4) විභක්ති සමාසයට ය.

11. ඇය දෙවඟනක මෙන් රූමත් ය. යන වාක්‍යයේ 'මෙන්' යනු,
(1) නාම පදයකි.
(2) විශේෂණ පදයකි.
(3) උපසර්ගයකි.
(4) නිපාත පදයකි.

12. 'අසමින්' යන ක්‍රියා පදයේ 'අස' යනු,
(1) ධාතු ප්‍රකෘතියකි. (2) ප්‍රත්‍යයකි. (3) නිපාතයකි. (4) විශේෂණයකි.

13. මගීහු **දුම්රිය මාර්ගයෙන්** ඉවත් වූහ. යන වාක්‍යයේ 'දුම්රිය මාර්ගයෙන්' යන්න,
(1) සම්ප්‍රදාන විභක්තියට අයත් වේ.
(2) කර්තෘ විභක්තියට අයත් වේ.
(3) අවධි විභක්තියට අයත් වේ.
(4) ප්‍රථමා විභක්තියට අයත් වේ.

- අංක **14** සිට **16** තෙක් ප්‍රශ්නවල, තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන උත්තරය තෝරන්න.

14. සන්නිවේදන **ශක්‍යතාව**, භාෂාව නිසා මිනිසාට ලැබුණු උරුමයකි.
(1) හැකියාව (2) මාර්ගය (3) පුරුද්ද (4) ප්‍රබලතාව

15. එම නිර්මාණයේ **මුඛ්‍යාර්ථය** වූයේ ජනතාව තුළ දේශානුරාගය ඇති කිරීමයි.
(1) මූලික ආදර්ශය
(2) මූලාරම්භය
(3) ප්‍රමුඛ තත්ත්වය
(4) මූලික අදහස

16. සුළි සුළඟින් **අවිනෂ්ට** වූ දේවල් දැක අපි පුදුම වූයෙමු.
(1) විනාශයට පත් වූ
(2) විනාශයට පත් නොවූ
(3) ප්‍රතිසංස්කරණය කළ
(4) විකෘත වූ

17. පහත සඳහන් පද අයත් වන ව්‍යාකරණ ප්‍රවර්ගය තෝරන්න.
කැහැටු, කළටි, පහටි
(1) තද්ධිත
(2) කෘදන්ත
(3) නිපාත
(4) රූඪි

18. පද කිහිපයක් කැටි කොට ගැනීමෙන් තනි පදයක් බවට සකස් වීම,
(1) තද්ධිත නාමයි. (2) සමාස නාමයි. (3) කෘදන්ත නාමයි. (4) සර්ව නාමයි.

19. එක් එක් පද පේළිවල දී ඇති පද යුගලවල සමානාර්ථවත් පද යුගලයක් ඇතුළත් **නො වන** පද පේළිය තෝරන්න.
(1) අංජන - අඳුන්, අත්සුණු - අග්ගළා, අග්‍ර - පරම, ගද්‍ය - ගැදි
(2) ආනන්දය - ප්‍රමෝදය, එකලා - තනි, දැමිටු - ධර්මිෂ්ඨ, මන්දස්මිතය - මඳ සිනහව
(3) රජ - නරේන්ද්‍ර, කඩුව - කග, රවි - දිවාකර, වියළි - ශුෂ්ක
(4) සකසුරුවම - අරපරෙස්සම, ඉඳුදුනු - දේදුන්න, පාසඟල - සරණයුග, විකසිත - මුකුලිත

20. විරුද්ධාර්ථවත් පද යුගලයක් **නො වන්නේ** මෙයින් කුමක් ද?
(1) අලංකාර - භූෂණ
(2) කුටිල - වංක
(3) අභිවෘද්ධිය - පරිහානිය
(4) බුහුමන - අවමන

21. 'භාෂාවේ උපත සම්බන්ධයෙන් මත කිහිපයක් පළ වී තිබේ.' යන වාක්‍යයේ 'උපත' යන්න වෙනුවට යෙදිය හැකි වඩාත් ම යෝග්‍ය පදය කුමක් ද?
(1) ප්‍රතිලාභය
(2) සම්භවය
(3) පුනරුප්පත්තිය
(4) පරිණාමය

22. වෙළෙන්දා පොළට ගොස් බඩු ගනිද්දී මිතුරෙක් පිටට තට්ටු කළේ ය.
ඉහත සඳහන් වාක්‍යයේ ඇති ක්‍රියාපද පිළිවෙළින් දැක්වෙන උත්තරය තෝරන්න.
(1) අසම්භාව්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා, අවසාන ක්‍රියා
(2) පූර්ව ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා, අවසාන ක්‍රියා
(3) පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, අවසාන ක්‍රියා
(4) ප්‍රයෝජ්‍ය ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, අවසාන ක්‍රියා

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

23. **වැරදි** අදහස දෙන වාක්‍යය තෝරන්න.
(1) කුකවි යනු අව්‍යය සමාසය සඳහා නිදසුනකි.
(2) බුජ බල යන්නෙහි අර්ථය බාහු ශක්තිය යන්නයි.
(3) 'කියග මගිය එනු කොහි සිට' යන වාක්‍යයේ කියග යනු පූර්ව ක්‍රියාවකි.
(4) අනුජාත යන වචනයේ අනු යනු උපසර්ගයකි.

24. ස්වරාදේශ සන්ධියට උදාහරණයක් **නො වන්නේ** කුමක් ද?
(1) දැත (2) අරුණෝදය (3) මහේශ්වර (4) පලාපල

25. දී ඇති අක්ෂර ගැළපීමෙන් නිර්මාණය වන නිවැරදි ග්‍රන්ථ නාමය තෝරන්න.
(1) ග ය මී හෙ ළි ර (2) යෝ ක ම රු ක් ගා ර (3) න ව බා ඩ න න් (4) හෙ මා යි ය රු ම් ව

- අංක **26, 27** යටතේ දී ඇති අදහසට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න.

26. කිසිම ආකාරයකින් නිදහසක් නොමැති වීම
(1) ඉස රුදාවට කොට්ටෙ මාරු කළා වගේ (2) ගහෙන් වැටුණු මිනිහට ගොනා ඇන්නා වගේ
(3) ගිරයට අහු වුණු පුවක් ගෙඩිය වගේ (4) කම්මලේ ඉන්න බල්ලා වගේ

27. තමන් කළ වැරැද්ද තමන්ට ම දැනීම
(1) අබ කෑ මිනිහාගේ නහය දනවා වගේ (2) අනුන්ට කැපූ වළේ තමන් වැටුණා වගේ
(3) හිල් කුඩෙන් වතුර අදිනවා වගේ (4) අටුවෙන් දුමට පැන්නා වගේ

28.
A - ජයතිස්ස සහ රොසලින් - මාර්ටින් වික්‍රමසිංහ
B - තොලසා - ශීඝ්‍රාර්ථයේ නිපාත
C - පරිණාමවාදය - යමක ක්‍රමික විකාශනය
D - අටු කොටු - යුගල පද

A, B, C, D ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ,
(1) A, B හා C ය. (2) A, B හා D ය. (3) A, C හා D ය. (4) B, C හා D ය.

- අංක **29, 30** යටතේ දී ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍යය තෝරන්න.

29. (1) මා විභාගයෙන් සමත් වෙති'යි සියලු දෙනා සිතයි.
(2) ශිෂ්‍යයන් කෝලාහලයට සම්බන්ධ නැත.
(3) මිනිස්සු විසින් ගස්වැල් ආරක්ෂා කරනු ලබයි.
(4) නාය යෑමෙන් සතුන් ද මිනිසුන් ද කරදරයට පත් විය.

30. (1) සියලු නළුනිළියෝ වේදිකාවේ රඟපානු ඇත.
(2) ළමයි ප්‍රවීණයන් මෙන් රංගනයේ යෙදුණහ.
(3) ඔවුන් දක්ෂ ක්‍රීඩකයෝ ද?
(4) අපි රෝගීන්ට උවටැන් කරනු වටී.

31. **පරිත්‍යාගශීලිහු** තම ආධාර විපතට පත්වූවන්ට බෙදා දුන්හ.
මතින් තොරවී නිරෝගීව **ජීවත් වන්න**.
ඔහු **නරියකු** මෙන් කපටි ය.
ප්‍රධානියා ලේකම්වරිය ලවා ලිපියක් **ලියවයි.**
ඉහත සඳහන් වාක්‍යවල තද කළු අකුරින් මුද්‍රිත පද හැඳින්වීම සඳහා යෙදෙන ව්‍යාකරණමය අනුඅංගවල අනුපිළිවෙළ කුමක් ද?
A - උක්ත කර්තෘ
B - අනුක්ත කර්මය
C - ප්‍රයෝජ්‍ය ක්‍රියා
D - විධි ක්‍රියා
(1) A,B,D,C (2) A,C,D,B (3) A,D,B,C (4) B,A,C,D

32. පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි වන්නේ කුමක් ද?
"අපි ගායකයන් එක්ක කතාබහ කළා."
(1) අපි ගායකයන් සමග කතාබහ කළෙමු.
(2) අප ගායකයන් සමග කතාබහ කළෙමු.
(3) ගායකයෝ සමග අපි කතාබහ කළෝ ය.
(4) ගායකයෝ සමග අපි කතාබහ කළෙමු.

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**33.** ඇරැව්වල නන්දිමිත්‍ර මහතාගේ නිර්මාණයක් වන්නේ,
(1) සෙංකොට්ටං (2) වතුර මල
(3) වක්කඩ බඳිමු (4) පියසේන ඇසූ ප්‍රශ්නයක්

**34.** රූපකයක් සහිත පාඨය තෝරන්න.
(1) මේ නේත්‍රද්වය නිසා ඈ සුනේත්‍රා නම් වන්නී ය. ඒ වර්ණයෙන් හා දීප්තියෙන් ඉඳුනිල්මිණි රුවනක් බඳු ය.
(2) සවනක් ගන බුදුරැසින් මුළු ලොව සදමින් වඩුත් වඩුත් සියලු නුවර රැසින් සැදෙත් සැදෙත් ගෙයි ගෙයි පිල්සක් විදහා මොනරු නටත් නටත්
(3) නානාවිධ විහඟ ගණයාගේ මධුර ඣංකාර කූහකූහාරව ගුමුගුමාරවාදීන් කන්කලු වූ සුපුෂ්පිත වැකොඳ තමාලලතාදි
(4) හේ මල්පෙති යුවළක්ව දෙතොලින් ආවරණය වුව ද සිනාසෙන කල පුෂ්පගර්භයක් මෙන් විකසිත වන බැවින් සිනහවට ම සැදුණු මුව පියුමෙකැයි කිව යුතු

**35.** තලමල පිපිලා, ගුරුතරුව, සඳගිර යන නාට්‍යවල නිර්මාණකරුවා වන්නේ,
(1) මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර ය. (2) ගුණසේන ගලප්පත්ති ය.
(3) ජයලත් මනෝරත්න ය. (4) හෙන්රි ජයසේන ය.

**36.** පහත සඳහන් කවියේ හතරවැනි පදය තෝරන්න.
"වලාකුළේ රත් පාටට විදුලි කොටනවා
ආකාසේ හඬ තළමින් අකුණු හඬනවා
බිංදු බිංදු මහ පොළොවට වතුර වැටෙනවා
....................................................."

(1) ගල් ගහන්නා වගේ වතුර කැට වැටෙනවා
(2) කළු වලා කැලඹෙමින් මුදුන් වී නැගෙනවා
(3) හෝ ගාමින් අපේ ගමට වැස්සක් එනවා
(4) වහිනවා වහිනවා වහිනවා වහිනවා

**37.** "රත්න දීප ජන්මභූමි
ලංකාදීප විජයභූමි
මේ අපේ උදාර වූ මාතෘ භූමියයි"

ඉහත සඳහන් වන්නේ ලංකාවේ ප්‍රසිද්ධ ගීතයක කොටසකි. එම ගීතයේ පදරචකයා වන්නේ,
(1) මහගමසේකර ය. (2) රත්න ශ්‍රී විජේසිංහ ය.
(3) ටිබෙට් ජාතික එස්. මහින්ද හිමි ය. (4) ඩබ්. ඒ. අබේසිංහ ය.

**38.** ධීවර ජනවහරේ දී ජම්පර කළුව වශයෙන් හඳුන්වන්නේ,
(1) වර්ෂාවයි. (2) වැහිකබායයි. (3) මාළු දැලයි. (4) සන්ධ්‍යා කාලයයි.

**39.** නුබ සා මඩුලු සඳ වෙල ළපලු පැහැපත
උදය'ග රුක සද මල් කැනක සිරි ගත
තර පතරින් සඳ'දර තර පහර දෙත
දිවගත එව් බියෙනැ'ලළෙමිනි දස අත

යන කවියෙන් කියැවෙන්නේ,
(1) වනාන්තරයක අසිරිය පිළිබඳව ය. (2) වර්ෂා කාලයක් පිළිබඳව ය.
(3) උදෑසන පිළිබඳව ය. (4) සන්ධ්‍යා කාලයක් පිළිබඳව ය.

**40.** පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අදහස දෙන උත්තරය තෝරන්න.
"ලංකාව තුළ ස්වාධීන සභ්‍යත්වයක මුල් බිජුවට සිටුවන ලද්දේ දිවයිනේ ජනාවාස කිරීමට මුල් වූවා සේ සැලකෙන විජය රජු විසින් නොව පළමු වැව කරවූ පණ්ඩුකාභය රජු විසිනි."
(1) නිදහස් ලංකාවක සංස්කෘතියේ ආරම්භය ඇති කළේ විජය රජු නොව පණ්ඩුකාභය රජු ය.
(2) ලක්දිවට අනන්‍ය වූ සභ්‍යත්වයක මූලාරම්භය සිදු කළේ විජය රජු නොව පළමුවන වැව කරවූ පණ්ඩුකාභය රජු ය.
(3) ලක්දිවට අනන්‍ය වූ සභ්‍යත්වයක මූලාරම්භය සටහන් වන්නේ විජය රජුගෙන් නොව පළමුවන වැව කරවූ පණ්ඩුකාභය රජුගෙනි.
(4) විජය රජු ලංකාව ජනාවාස කළත් ලංකාවේ නිදහස් සභ්‍යත්වයක ආරම්භය සිදු වූයේ පණ්ඩුකාභය රජු කරවූ පළමුවන වැව නිසා ය.

**



WWW.OLEVELAPI.COM
අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2017
க.பொ.த (சா.தர)ப் பரீட்சை - 2017

| විෂයය අංකය<br>பாட இலக்கம் | 21 | විෂයය<br>பாடம் | සිංහල භාෂාව හා සාහිත්‍යය (නව නිර්දේශය) |
|---|---|---|---|

### I පත්‍රය - පිළිතුරු
### I பத்திரம் - விடைகள்

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 2 | 11. | 4 | 21. | 2 | 31. | 3 |
| 02. | 1 | 12. | 1 | 22. | 3 | 32. | 1 |
| 03. | 4 | 13. | 3 | 23. | 3 | 33. | 2 |
| 04. | 3 | 14. | 1 | 24. | 1,2,3,4 | 34. | 4 |
| 05. | 2 | 15. | 4 | 25. | 4 | 35. | 3 |
| 06. | 4 | 16. | 2 | 26. | 3 | 36. | 3 |
| 07. | 2 | 17. | 1 | 27. | 1 | 37. | 1 |
| 08. | 2 | 18. | 2 | 28. | 4 | 38. | 2 |
| 09. | 1 | 19. | 4 | 29. | 1,2,3,4 | 39. | 4 |
| 10. | 3 | 20. | 1 , 2 | 30. | 2 | 40. | 2 |

WWW.OLEVELAPI.COM

(24) (29) ප්‍රශ්න ලකුණු කර නැතත් ලකුණු දෙන්න.

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින் / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

24 හා 29 ප්‍රශ්න සඳහා උත්තර ලකුණු කර නැතත් ලකුණු පිරිනමන්න.

පහත නිදසුනෙහි දැක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

| | | | |
|---|---|---|---|
| නිවැරදි පිළිතුරු සංඛ්‍යාව<br>சரியான விடைகளின் தொகை | 25<br>40 | I පත්‍රයේ මුළු ලකුණු<br>பத்திரம் I இன் மொத்தப்புள்ளி | 25<br>40 |

24 වන ප්‍රශ්නය සඳහා නිවැරදි පිළිතුර 4 වුවත් 10 ශ්‍රේණියේ පෙළපොතෙහි ස්වරාදේශ සන්ධියට උදාහරණ ලෙස 'පලාපල' යන වචනය සඳහන් කර ඇති නිසා සිසුන්ට අසාධාරණයක් නොවන පරිදි ලකුණු පිරිනැමේ.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

WWW.OLEVELAPI.COM



# 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය
## II පත්‍රය

**ප්‍රශ්න අංකය 01**

**අපේක්ෂණය - භාෂා පරිචය ඇගයීම**

මෙම ප්‍රශ්නයට කෙටි උත්තර අපේක්ෂිත අනුප්‍රශ්න දහයක් ඇතුළත් වේ. අනු ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් ලකුණු 20කි.

1. (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ **උත්තර නොලියන්නේ** නම්, එහි **අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) සිංහල හෝඩියේ ඇතුළත්
 (අ) සඤ්ඤක (ආ) ඌෂ්ම
 අක්ෂරය බැගින් ලියන්න.

(ii) පහත සඳහන් පද විසන්ධි කොට ලියන්න.
 (අ) වියවුල් (ආ) ගංදිය

(iii) පහත සඳහන් වාක්‍යයේ වචන **දෙකක** අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන **දෙක** පමණක් නිදොස් කර ලියන්න.
 "විශිෂ්ඨ ක්‍රියාමාර්ග අනුගමනය කිරීමෙන් මෙරට අපරාධ මර්ධනය කළ හැකි ය."

(iv) පහත දැක්වෙන පදවලට විරුද්ධාර්ථවත් පදය බැගින් ලියන්න.
 (අ) උපද්‍රව (ආ) උත්තම

(v) පහත සඳහන් පද්‍ය ඛණ්ඩයෙහි ඇතුළත් කෘදන්ත පද **දෙකක්** ලියන්න.
 "දුම්බර කෙතට වැට බැඳලා රැකුම් බැලුම්"

(vi) පහත සඳහන් (අ) සහ (ආ) හි දැක්වෙන වාක්‍ය සදොස් ය. ඒවා නිදොස් කර නැවත ලියන්න.
 (අ) වෛද්‍යවරුන් රෝහලේ ඇත.
 (ආ) ගුරුවරු සමඟ ශිෂ්‍යයෝ ද ශ්‍රමදානයට සහභාගි වූහ.

(vii) පහත සඳහන් වාක්‍යයේ ඇතුළත් සමාස පද **දෙක** නම් කරන්න.
 "අධ්‍යාපන චාරිකාවට සහභාගි වූ දරුදැරියෝ ඉමිහිරි ගී ගයමින් විනෝද වූහ."

(viii) පහත සඳහන් (අ) සහ (ආ) යටතේ දැක්වෙන අදහස්වලට ගැළපෙන තනි පදය බැගින් ලියන්න.
 (අ) දැවයෙන් කරන ලද
 (ආ) රාත්‍රියෙහි හැසිරෙන

(ix) පහත සඳහන් වාක්‍ය **දෙක** කර්මකාරකයට හරවා ලියන්න.
 (අ) දන්ත වෛද්‍යවරු මුඛ රෝග පිළිබඳව පාසල් සිසුන් දැනුවත් කළහ.
 (ආ) නළුනිළියෝ විචිත්‍රවත් රංගනයක යෙදෙමින් ප්‍රේක්ෂකයින් සතුටට පත් කරති.

(x) පහත දැක්වෙන වාක්‍යයේ ඇතුළත් යුගල පද **දෙක** තෝරා වෙන වෙන ම ලියන්න.
 "වතු පිටි විනාශ කරමින් ගම් වැදුණු වන අලි රංචුව දැකීමෙන් මාගේ මිත්‍රයා තක්කු මුක්කු වූයේ ය."

(ලකුණු 2 × 10 = 20 යි)

01.

(i) (අ) ග ජ ඩ ද බ

 (ආ) ශ ෂ ස හ ෆ (අ)ඃ /ඃ

WWW.OLEVELAPI.COM

(ii) (අ) වි + අවුල්

 (ආ) ගඟ + දිය

(iii) විශිෂ්ට , මර්දනය

(iv) (අ) නිරුපද්‍රව / අනුපද්‍රව / ශාන්තිය / සෙත / යහපත

 (ආ) අධම / නීච / පහත් / නිහීන / තුච්ඡ / හීන

(v) රැකුම්, බැලුම්

(vi) (අ) වෛද්‍යවරු රෝහලේ ඇත. ( මෙම නිවැරදිම තිබිය යුතුය. )

 (ආ) ගුරුවරුන් සමග ශිෂ්‍යයෝ ද ශ්‍රමදානයට සහභාගි වූහ.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

(vii) දරුදැරියෝ, ඉම්හිරි

(viiii) (අ) දැවමුවා / දාරුමය / දැවමය

(ආ) නිශාචර

(ix) (අ) දන්ත වෛද්‍යවරුන් විසින් මුඛ රෝග පිළිබඳව පාසල් සිසුහු දැනුවත් කරන ලදහ. / ලද්දෝය./ ලැබූහ./ ලැබුවෝය/ කරනු ලැබුණාහ. / දැනුවත් කෙරුණු. / දැනුවත් කෙරුණාහ.

(ආ) නළුනිළියන් විසින් විචිත්‍රවත් රංගනයක යෙදෙමින් ප්‍රේක්ෂකයෝ සතුටට පත් කරනු ලබති./ ලබන්නෝ ය. / ලබන්නාහු ය. / පත් කෙරෙති. / පත්කරනු ලබති,

(x) වතුපිටි, තක්කුමුක්කු

**ප්‍රශ්න අංකය 02**

**අපේක්ෂණය - සංශ්ලේෂණ හැකියාව මැනීම**

මේ ප්‍රශ්නය සැකසීමේ දී අනුගමනය කර ඇත්තේ මාර්ගෝපදේශිත රචනා මූලධර්මය යි. එනම් ඉදිරිපත් කොට ඇති මග පෙන්වීම ප්‍රයෝජනයට ගනිමින් කිසියම් රචනාවක් කිරීමට අපේක්ෂකයාට ඉඩ සැලැස්වීම යි. රචනයේ ඇතුළත් විය යුතු කරුණු, විස්තරය ඇසුරෙන් වටහා ගත යුතු ය. රචනයෙහි විය යුතු ඡේද සංඛ්‍යාව ගැන වැටහීමක් දී ඇති විස්තරයෙන් ලබා ගත හැකිය. මාතෘකාව ඉදිරිපත් කොට නැතත්, ඉදිරිපත් කොට ඇති විස්තර ඇසුරෙන් මාතෘකාව සකස් කර ගැනීමට අපේක්ෂකයාට අවසර ඇත.

2. පහත දැක්වෙන **(අ), (ආ), (ඉ), (ඊ)** යන විස්තර අතුරෙන් **එකක්** තෝරා ගෙන **වචන 250කට නො අඩු** වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා **යෝග්‍ය මාතෘකාවක්** ද යොදන්න.

**(අ)** ශ්‍රී ලංකාවේ වන අලි බෝවීමේ ප්‍රවණතාව ඉහළ යෑම හා ඔවුන් පාලනය කිරීමේ ක්‍රමෝපායයන් පිළිබඳව මේ දිනවල විවිධ අදහස් පළ වේ. බොහෝ කාලයක පටන් මෙරට පවතින අලි-මිනිස් ගැටුම හේතුවෙන් අලින්ගේ සහ මිනිසුන්ගේ ජීවිත මෙන් ම දේපළවලට ද සිදු වන හානිය ගණනය කළ නොහැකි තරම් ය. එනිසා වන අලි මෙරටට සම්පතක් බවට පත්කර ගැනීමේ උපක්‍රම පිළිබඳව පරිසරවේදීන්ගේ අවධානය යොමු විය යුතු ය.

**(ආ)** ජනගහනය අධික වීම මෙන් ම නියඟ හා ගංවතුර වැනි ස්වාභාවික ආපදා හේතුවෙන් ආහාර අර්බුදයක් හට ගනිමින් තිබීම සමස්ත ලෝක ප්‍රජාවට ම මුහුණ දීමට සිදුව ඇති අභියෝගයකි. කෘෂිකර්මාන්තය අතහැර වෙනත් වෘත්තීන්වල නියැලීමට මිනිසුන් පෙලඹීම ද මේ තත්ත්වය ඇති වීමට බලපා තිබේ. මේ අර්බුදයට විධිමත් හා කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතු ය.

WWW.OLEVELAPI.COM

**(ඉ)** ලොව බොහොමයක් රටවල නිදහස් සෞඛ්‍ය සේවාවක් නොමැත. රෝගීන් සිය පෞද්ගලික වියදමෙන් ප්‍රතිකාර හා ඖෂධ ලබාගත යුතු ය. ශ්‍රී ලංකාව නිදහස් සෞඛ්‍ය සේවාවක් පවතින රටක් වුවත් ඖෂධ නිෂ්පාදන සමාගම් අතර පවතින තරගකාරිත්වය හා ඖෂධවල මිල ගණන් ඉහළ පහළ යෑම නිසා එහි ප්‍රතිලාභ සාමාන්‍ය ජනතාවට සම්පූර්ණයෙන් ම නොලැබෙන බවට ඔවුහු මැසිවිලි නගති. ඒ අනුව නිදහස් සෞඛ්‍ය ප්‍රතිපත්තියේ ප්‍රතිලාභ සාමාන්‍ය ජනයාට අත්වන අන්දමේ ක්‍රියා පිළිවෙතක් සකස් කිරීම කාලීන අවශ්‍යතාවකි.

**(ඊ)** ළමයින්ගේ පෞරුෂ සංවර්ධනයේ දී අතීතයේ විසූ වීරවරයන්ගේ සහ වීරවරියන්ගේ චරිතාපදානවලින් සැපයෙන පිටුබලය ඉමහත් ය. මෙරට රූපවාහිනී නාළිකා ඔස්සේ ප්‍රචාරය වන හරසුන් ටෙලිනාට්‍ය සහ කාටූන් වැඩසටහන් වෙනුවට වීර චරිත තේමා කර ගැනුණු නාට්‍ය නිෂ්පාදනය කිරීමෙන් ළමයින්ගේ කලා රසඥතාව වර්ධනය කිරීමට මෙන්ම ඉතිහාසය පිළිබඳ දැනුම ලබාදීමට ද හැකිවනු ඇත.

(ලකුණු 25 යි)



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

02. රචනා සඳහා ආදර්ශ මාතෘකා කිහිපයක්.

(අ) 1. වන අලි මෙරට සම්පතක් බවට පත්කර ගැනීමේ උපක්‍රම
2. අලි මිනිස් ගැටුම් නිසා ඇති වන හානි
3. වන අලි වර්ධනය පාලනය කිරීමේ ක්‍රමෝපාය

(ආ) 1. ස්වාභාවික ආපදා නිසා ඇති වන ආහාර අර්බුදයට විධිමත් හා කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතු ය
2. ස්වාභාවික ආපදා වළක්වා ගැනීමේ උපාය මාර්ග
3. ස්වාභාවික ආපදා හේතුවෙන් සමස්ත ලෝක ප්‍රජාව මුහුණ දෙන අභියෝග
4. ජනගහනය අධික වීම හා ස්වාභාවික ආපදා

(ඉ) 1. නිදහස් සෞඛ්‍ය සේවාව විධිමත් කිරීමේ ක්‍රියාමාර්ග
2. නිදහස් සෞඛ්‍ය සේවයේ ප්‍රතිලාභ සාමාන්‍ය ජනතාවට ලබාදීමේ ක්‍රියාමාර්ග

(ඊ) 1. කලා රසාඥතාව හා ඉතිහාසය පිළිබඳ දැනුම නාට්‍ය නිෂ්පාදනය මගින් ළමා මනසෙහි ජනිත කිරීම
2. වීර චරිත තේමා කොට ගත් ටෙලි නාට්‍ය නිෂ්පාදනයෙන් ළමා පෞරුෂය වර්ධනය කිරීම
3. ළමා පෞරුෂ වර්ධනයට අතීත වීරුවන්ගේ චරිත මගින් ගත හැකි ආදර්ශ

**ලකුණු විග්‍රහය - මුළු ලකුණු 25යි**

| | | |
|---|---|---|
| 01. සාරවත්භාවය, මාතෘකාව ද ඇතුළුව | - | ලකුණු 08යි |
| 02. සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය | - | ලකුණු 12යි |
| 03. ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම | - | ලකුණු 05යි |

01. සාරවත්භාවය - ලකුණු 07යි
විස්තරයට අදාළ වන පරිදි මාතෘකාවක් යොදා තිබීම - ලකුණු 01යි

තේමාවට අදාළ බව, ඉදිරිපත් කොට ඇති ව්‍යුහයට සමීප බව, සරුබව හා සමබව, වචන ගණන 250 සමීප ව පැවතීම යන කරුණු සාරවත්භාවය යටතේ සැලකිල්ලට ගත යුතු වේ.

02. සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය - ලකුණු 12යි
මෙහි දී උසස් ප්‍රකාශන ශක්තිය, සංවිධානය, ස්වීයත්වය, නිර්මාණාත්මක ප්‍රකාශන, ව්‍යක්ත ලේඛන ව්‍යවහාරය ආදි අංශ ගැන සලකා බැලිය යුතු ය.

03. ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම - ලකුණු 05යි
වියරණ, අක්ෂර, විරාම ලක්ෂණ භාවිතය, ඡේද අදාළ පරිදි වෙන් කොට තිබීම, පද වෙන් කොට ලිවීම යන අංශ ගැන සලකා බලා ලකුණු තීරණය කළ යුතු වේ.

❖ **සැලකිය යුතුයි**

01. රචනයේ වචන ගණන දළ වශයෙන් 200ට වඩා අඩු වන කල්හි ඉහත දැක්වූ 1, 2, 3 යන කොටස්වලට අනුපාතික ව ලකුණක් තීරණය කළ යුතු වේ.

02. වැදගත් අදහස්, සිත් ගන්නා ප්‍රකාශන ඇති තැන්වල (✓) යොදන්න. වැරදි තැන්වල (×) ලකුණු යොදන්න.

03. උක්තාඛ්‍යාත සම්බන්ධ වැරදි තැන් යටින් ඉරක් අඳින්න. අක්ෂර වින්‍යාසය වැරදි වචන වටා රවුමක් අඳින්න.
1, 2, 3 යන කොටස් සඳහා දෙන ලද ලකුණු උත්තරය අග හරස් අතට ලියා එකතු කර, මුළු ලකුණු ගණන ලබා ගන්න.

නිදසුන් $\frac{6}{8}$ $\frac{9}{12}$ $\frac{3}{5}$ $\frac{18}{25}$

සංලක්ෂය

★ වාක්‍ය රචනා ඇගයීමට පෙර අදාළ ව්‍යුහය කියවා දළ සැලැස්මක් සකස් කරගන්න. ව්‍යුහයට කිසිසේත් අදාළ නො වන සේ ලියා ඇති රචනා ඇගයීමේ දී සාරවත්භාවය සඳහා පිරිනැමිය යුත්තේ ඉතා අඩු ලකුණකි.

★ රචනය දුර්වල වුවත් මුළු ලකුණු වශයෙන් බින්දුව නො දෙන්න. සමස්තයක් ලෙස සලකා ලකුණු 02 - 05 අතර සංඛ්‍යාවක් පිරිනමන්න. උපරිම ලකුණු 05 ඉක්මවිය යුතු නො වේ.



WWW.OLEVELAPI.COM
අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**ප්‍රශ්න අංකය 03**

**අපේක්ෂණය** - කිසියම් කොටසක් කියවා, විස්තර වර්ණනා බැහැර කරමින්, එහි හරය වටහා ගෙන, ඒ ඇසුරින් සමස්ත අර්ථය තම වචනයෙන් ඉදිරිපත් කිරීමේ හැකියාව මෙහි දී ඇගයේ. එසේ ම සංශ්ලේෂණ මෙන් ම විශ්ලේෂණ හැකියාව ද ඇගයීමට භාජනය කෙරේ.

**3.** පහත දැක්වෙන පාඨය වචන **55 - 65** අතර වන සේ **සාරාංශ කොට** ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

රටක උන්නතියෙහි පදනම ඉහළ සාක්ෂරතාවයි. දේශගුණික විපර්යාස හා ඉන් මිහිතලයට එල්ල වන පෙර නොවූ විරූ පාරිසරික තර්ජන පිළිබඳව ගෝලීය ප්‍රජාවගේ දැනුවත්භාවය වඩාත් හොඳින් ඉහළ නැංවීම, ඒවා අවම කර ගැනීමට මහෝපකාරී වේ. පරිසරය ආරක්ෂා කිරීම පිළිබඳ අවධානය හා ඒ සඳහා ගත යුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ධෛර්යවත් කිරීම සඳහා සියලු ලෝකවාසී ප්‍රජාව දැනුමින් සවිබල ගැන්වීම කාලීන අවශ්‍යතාවකි.

ගෝලීය උෂ්ණත්වය ඉහළ යෑම නිසා සිදුවන දේශගුණ විපර්යාස මිනිසාගේ පැවැත්මට ඇති ප්‍රධාන අභියෝගය ලෙස මේ වන විට හඳුනාගෙන තිබේ. ගෝලීය උෂ්ණත්වය ඉහළ යෑම මානව ක්‍රියාකාරකම් හේතුවෙන් වායුගෝලයට එකතු වන හරිතාගාර වායුවල ප්‍රතිඵලයක් වේ.

දේශගුණ විපර්යාස යනු මිනිසාගේ ක්‍රියාකාරකම් හේතුවෙන් වායුගෝලයේ ඇති වායු සංයුතියෙහි වෙනස් වීම නිසා දේශගුණයේ ඇති වන නොයෙකුත් වෙනස් වීම් ලෙස සරලව හඳුන්වා දිය හැකි ය. දේශගුණ ක්‍රියාවලිය සංකීර්ණ, එකිනෙක සමග අන්තර් ක්‍රියා කරන, එකිනෙක සමග සම්බන්ධතාවක් ඇති, වායුගෝලය, ගොඩබිම, අයිස් හා හිම, සාගර හා අනෙකුත් ජල පද්ධතිවලින් සමන්විත වූවක් වන අතර එම දේශගුණ පද්ධති සඳහා අවශ්‍ය ශක්තිය සූර්ය විකිරණ මගින් ලබා දේ. ෆොසිල ඉන්ධන දහනය වැඩි වශයෙන් සිදුවීම දේශගුණ විපර්යාසවලට ප්‍රධාන හේතුව වී ඇත. එම නිසා නිශ්චිතව ම වර්තමාන සහ අනාගත පරපුරට දේශගුණ විපර්යාසවලට මුහුණ දෙමින් ජීවත් වීමට සිදු වන බව දේශගුණ විපර්යාස පිළිබඳ අන්තර් රාජ්‍ය මණ්ඩලය තහවුරු කර ඇත. නිවර්තන කලාපයට අයත් සංවර්ධනය වෙමින් පවතින රටක් වන ශ්‍රී ලංකාව දේශගුණ විපර්යාසවලට හේතු වන ක්‍රියාකාරකම් සඳහා ඉතා ම අඩුවෙන් දායක වුවත්, දේශගුණ විපර්යාස නිසා ඇති වන අහිතකර බලපෑම්වලට මුහුණ දීමට සිදුව ඇති රටකි.

(ලකුණු 10 යි)

03. **සාරාංශකරණය**

අන්තර්ගතය

(i) රටක උන්නතියෙහි පදනම ඉහළ සාක්ෂරතාවයි.

(ii) ගෝලීය උෂ්ණත්වය ඉහළ යෑම මානව ක්‍රියාකාරකම් නිසා සිදු වන්නෙකි.

(iii) දේශගුණික විපර්යාස නිසා මිහිතලයට පාරිසරික තර්ජන එල්ල වන අතර දේශගුණික විපර්යාස නිසා වන අහිතකර බලපෑමට ශ්‍රී ලංකාවට ද මුහුණ දීමට සිදු වේ..

(iv) ගෝලීය ප්‍රජාවගේ දැනුවත් වීම ඉහළ නැංවීම කාලීන අවශ්‍යතාවකි.

(v) දේශගුණික පද්ධති සඳහා අවශ්‍ය ශක්තිය සූර්ය කිරණෙන් ලැබේ.

(vi) දේශගුණ විපර්යාසවලට ප්‍රධාන හේතුව ෆොසිල ඉන්ධන දහනයයි.

**සාරාංශකරණය :**

**මුළු ලකුණු ප්‍රමාණය 10යි.**

WWW.OLEVELAPI.COM

**ලකුණු විග්‍රහය :**

01. අන්තර්ගතය - ***ලකුණු 06යි.***
02. වචන ගණන - ***ලකුණු 02යි.***
03. ශිල්පීය දක්ෂතා - ***ලකුණු 02යි.***

* වචන 70ක් තිබුණත් ලකුණු 2 ම දෙන්න.

වචන ගණන 70 ඉක්මවන කල්හි සැලකිය යුත්තේ මුල් වචන 65 තුළ ඇති ප්‍රධාන අදහස් පමණි. වචන 50ට අඩු කල්හි එහි ඇතුළත් අදහස් ගණනය කොට ඊට සුදුසු අනුපාතික ලකුණක් පිරිනමන්න. උත්තරය ඡේදයක් සේ ලියා තිබිය යුතු ය. කොටුවක් තුළ පද බෙදා තිබුණ ද පිළිගන්න. එක යට එක අසම්බන්ධිත වාක්‍ය වශයෙන් ලියා ඇත්නම් අන්තර්ගතයට දිය හැකි උපරිම ලකුණු ගණන 02 කි. වචන ගණනයේ දී ලිහිල් පිළිවෙතක් අනුගමනය කරන්න. වචන ගණන දළ වශයෙන් 70ට වැඩි කල්හි හෝ 50ට අඩුවන කල්හි වචන ගණන සඳහා ලකුණු 01 පිරිනමන්න.

★ දුර්වල සාරාංශ සඳහා බින්දුව සමස්ත ලකුණක් වශයෙන් නො සොඳන්න. ලකුණු 03ක උපරිමයකට යටත්ව සමස්ත ලකුණ පිරිනමන්න.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**ප්‍රශ්න අංකය 04**

**අපේක්ෂණය** - ඉදිරිපත් කොට ඇති ඡේදය ඇසුරින් අවබෝධ හැකියාව මැනීම.

**4.** පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට **කෙටි පිළිතුරු** සපයන්න.

ලෝකයේ බොහෝ රටවල් හා සැසඳීමේ දී අප රටෙහි විදුලි ඒකකයක මිල අධික අගයකි. එබැවින් ආයෝජකයෝ ආයෝජනයට මැළිකමක් දක්වති. ශ්‍රී ලංකාවේ දෛනික විදුලිබල පරිභෝජනය 2000 MW පමණ වේ. වසරේ වැඩි කාලයක දී එයින් වැඩි ප්‍රතිශතයක් නිපදවනුයේ තාප බලාගාර මගිනි. ගල් අඟුරු, තෙල් යන කුමන ආකාරයෙන් ක්‍රියා කළ ද ඉදිරි වසර කීපය තුළ දී මිල ඉහළ යාම, තෙල් නිධි අවසන් වීම යන කරුණු නිසා එම බලාගාර මත පැවැත්ම රටට විශාල අවදානමකි.

ශ්‍රී ලංකාව කුඩා රටක් වුව ද ජනඝනත්වය ඉතා ඉහළ නිසා බලාගාර ආකෘතියෙන් බලශක්ති අර්බුදයට එක් හොඳ විසඳුමක් විය හැක්කේ න්‍යෂ්ටික බලාගාරයි. එහෙත් න්‍යෂ්ටික බලාගාරයක් අත් කර ගැනීමට අප රටෙහි ජනතාවගේ සහ පාලකයන්ගේ අවබෝධය, ආකල්ප, කැපවීම සහ ශක්තිය තවමත් ප්‍රමාණවත් තැනක නැත. එම නිසා වෙනත් විකල්ප කෙරෙහි යොමු වීම ඉතා වැදගත් වේ.

වසරකට පෘථිවියට ලැබෙන සූර්ය ශක්තිය 173000 TW පමණ වේ. එය මානව අවශ්‍යතාව මෙන් 10000 ගුණයකි. එම නිසා පරිසර සාධක වැනි සියලු කරුණු සැලකිල්ලට ගත් විට මුළු ලෝකය ම යොමු විය යුතු ප්‍රධානතම බලශක්ති ප්‍රභවය විය යුත්තේ සූර්ය ශක්තියයි. සූර්ය පැනල ව්‍යාප්ති මගින් ද අනාගතයේ විශාල පාරිසරික ගැටලු මතුවනු ඇත. මන්ද මේවා ඉවත් කරන විට එය විසල් ගැටලුවකට මඟ පාදන බැවිනි. එම නිසා දැනටමත් සූර්ය පැනල සවිකරන හා ඒවා මෙරටට ගෙන්වන ආයතන ඒවා නැවත බැහැර කරන ආකාරය පිළිබඳව පැහැදිලි කළ යුතු ය. එමෙන්ම ඇතැම් සූර්ය කෝෂ විෂ සහිත සංයෝග මගින් නිපදවෙන නිසා ඒවා ලංකාවට ගෙන ඒමේ දී රජය ඉතා සැලකිලිමත් විය යුතු ය.

(i) ආයෝජකයින් ශ්‍රී ලංකාවේ ආයෝජනයට පසුබට වන්නේ කුමන කරුණක් නිසා ද?
(ii) තාප බලාගාර මත පැවැත්ම රටට විශාල අවදානමක් වන්නේ කවර හේතු නිසා ද?
(iii) ශ්‍රී ලංකාවට න්‍යෂ්ටික බලාගාරයක් අත්කර ගැනීමට බාධා පමුණුවන කරුණු මොනවා ද?
(iv) මුළු ලෝකයේ ම අවධානය යොමු විය යුතු ප්‍රධාන බලශක්ති ප්‍රභවය වශයෙන් ලේඛකයා හඳුන්වන්නේ කුමක් ද?
(v) සූර්ය පැනල මෙරටට ගෙන්වීමේ දී රජය සැලකිලිමත් විය යුත්තේ ඇයි?

(ලකුණු 10 යි)

04.

(i) බොහෝ රටවල් හා සැසඳීමේ දී අප රටෙහි විදුලි ඒකකයක මිල අධික අගයක් ගැනීම නිසා

(ii) ගල් අඟුරු, තෙල් යන කුමන ආකාරයෙන් ක්‍රියාකළ ද ඉදිරි වසර කිහිපය තුළ දී මිල ඉහළ යාම) හා (තෙල් නිධි අවසන් වීම නිසා)

*(එක් කරුණකට ලකුණු 01 යි)*

(iii) (අප රටේ ජනතාවගේ සහ පාලකයන්ගේ අවබෝධය) (ආකල්ප, කැපවීම සහ ශක්තිය තවමත් ප්‍රමාණවත් තැනක නො තිබීම)

(තවමත් යනුවෙන් නොතිබුණ ද ලකුණු දෙන්න.)

(iv) සූර්ය ශක්තිය

(v) මේවා ඉවත් කරන විට විශාල ගැටලුවලට මඟ පෑදීම
අනාගතයේ විශාල පාරිසරික ගැටලු ඇති වීම
ඇතැම් සූර්ය කෝෂ විෂ සහිත සංයෝග මගින් නිපදවා තිබීම

*(කරුණු 2 ක් ඇත්නම් ලකුණු 02 යි. එක් කරුණක් සඳහා ලකුණු 01 යි)*

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**ප්‍රශ්න අංකය 05**

**අපේක්ෂණය** - ප්‍රායෝගික ලේඛන හැකියාව පිළිබඳ අපේක්ෂයා සතු කුසලතා මැනීම.

**5.** පහත දැක්වෙන විස්තරය පදනම් කොටගෙන අත් පත්‍රිකාවක් සකස් කරන්න. මේ සඳහා වචන **100**ක් පමණ යොදා ගැනීම ප්‍රමාණවත් ය.

ආහාර පරිභෝජනයේ දී භාවිතයට ගැනෙන පොලිතින් හා ප්ලාස්ටික් අසුරනවලට විකල්පයක් වශයෙන් කෙසෙල් කොළ භාවිතයෙන් ආහාර ඇසුරුම් සකස් කිරීම සඳහා පුහුණු කිරීමේ වැඩමුළුවක් හෙට්ටිගොඩ ප්‍රාදේශීය සභාවේ ප්‍රජා සංවර්ධන ඒකකය මඟින් සංවිධානය කොට ඇත. ස්ත්‍රී-පුරුෂ හා වයස් භේදයකින් තොරව ඕනෑම අයෙකුට මෙම වැඩමුළුවට සහභාගි විය හැකි අතර අදාළ පුහුණුව ලැබීමෙන් අනතුරුව නව නිෂ්පාදන හඳුන්වා දෙන පුද්ගලයන්ට ඒවා වැඩිදියුණු කරගැනීම සඳහා බැංකු ණය පහසුකම් ප්‍රදානය කිරීම මෙන් ම අලෙවි කර ගැනීම සඳහා අවශ්‍ය මඟ පෙන්වීම ද සිදු කෙරේ. ප්‍රජා සංවර්ධන ඒකකයේ ලේකම් මාධව අතපත්තු ඔබ යැයි උපකල්පනය කරන්න.

**නැතහොත්**

ඔබ විසින් අලුතින් ආරම්භ කරන ලද මුද්‍රණ ආයතනයේ සේවාවන් පිළිබඳ සඳහන් කරමින් පුවත්පතක පළ කිරීම සඳහා සුදුසු ආකර්ෂණීය වෙළෙඳ දැන්වීමක් සකස් කරන්න. පහසු මිල ගණන්, ගුණාත්මක සහ කලාත්මක භාවයෙන් යුක්ත කඩිනම් සේවාව, වාරික වශයෙන් මුදල් ගෙවීමේ හැකියාව යන කරුණු අවධාරණය විය යුතු ය.

(මේ සඳහා වචන **100**ක් පමණ ප්‍රමාණවත් ය.)

(ලකුණු 15 යි)

05.

**අත් පත්‍රිකාව**

| | | |
|---|---|---|
| 1. | ආකෘතිය | ලකුණු 5යි |
| 2. | අන්තර්ගතය | ලකුණු 7යි |
| 3. | ශිල්පීය දක්ෂතා | ලකුණු 3යි |
| | මුළු ලකුණු | ලකුණු 15යි |

1. **ආකෘතිය** - ලකුණු 05යි.
   1. ශීර්ෂ පාඨය / මාතෘකාව — ලකුණු 1යි.
   2. පළ කරන්නාගේ නම හෝ තනතුර — ලකුණු 1යි.
   3. පළ කරන දිනය — ලකුණු 1යි.
   4. නිර්මාණාත්මක බව — ලකුණු 2යි.

2. **අන්තර්ගතය** - ලකුණු 07යි.
   1. පොලිතීන් හා ප්ලාස්ටික් අසුරනවලට විකල්පයක් වශයෙන් කෙසෙල් කොළ භාවිතයෙන් ආහාර ඇසුරුම් සකස් කිරීම
   2. එම ඇසුරුම් සකස් කිරීමේ වැඩමුළුව හෙට්ටිගොඩ ප්‍රාදේශීය සභාවේ දී පැවැත්වීම
   3. දිනය සහ වේලාව
   4. සංවිධානය: ප්‍රාදේශීය සභාවේ ප්‍රජා සංවර්ධන ඒකකය
   5. ස්ත්‍රී පුරුෂ වයස් භේදයකින් තොරව සහභාගි වීමේ හැකියාව
   6. පුහුණුව ලැබීමෙන් පසු නව නිෂ්පාදන හඳුන්වා දෙන අයට බැංකු ණය පහසුකම් සැලසීම
   7. එම නිෂ්පාදන අලෙවි කර ගැනීමට වෙළෙඳපොළ සකස් කිරීමේ ප්‍රවර්ධන වැඩසටහන්

3. **ශිල්පීය දක්ෂතා** ලකුණු 03යි.

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

WWW.OLEVELAPI.COM



නැතහොත්

වෙළෙඳ දැන්වීම

ලකුණු විග්‍රහය - මුළු ලකුණු 15යි.

1. ආකෘතිය සඳහා ලකුණු 05යි.
2. අන්තර්ගතය සඳහා ලකුණු 07යි.
3. ශිල්පීය දක්ෂතා සඳහා ලකුණු 03යි.

1. **ආකෘතිය ලකුණු 05යි.**

   1. මාතෘකාව ලකුණු 01යි.
   2. පළ කරන්නාගේ නම, තනතුර ලකුණු 01යි.
   3. පළ කරන දිනය ලකුණු 01යි.
   4. නිර්මාණාත්මක බව ලකුණු 02යි.

2. **අන්තර්ගතය සඳහා ලකුණු 07යි.**

   1. මුද්‍රණ ආයතනයේ නම ලකුණු 01යි.
   2. මුද්‍රණ ආයතනයේ සේවාවන් ලකුණු 01යි.
   3. මිල ගණන් ලකුණු 01යි.
   4. ගුණාත්මක භාවය ලකුණු 01යි.
   5. කලාත්මක භාවය ලකුණු 01යි.
   6. කඩිනම් සේවාව ලකුණු 01යි.
   7. වාරික වශයෙන් මුදල් ගෙවීමේ හැකියාව ලකුණු 01යි.

3. **ශිල්පීය දක්ෂතා ලකුණු 03යි.**

නිවැරදි අක්ෂර වින්‍යාසය, උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය, පැහැදිලි අත්අකුරු, නිවැරදි පද බෙදීම, වියරණ, විරාම ලක්ෂණ, ඡේද වෙන් කිරීම සමස්තයක් ලෙස සලකා ලකුණු පිරිනමන්න.

❖ නියමිත වචන ගණන අඩු වන කල්හි හෝ ප්‍රමාණවත් කරුණු හෝ අදාළ කරුණු අන්තර්ගත නො වන අඩුපාඩු සහිත උත්තර ඇති කල්හි අනුපාතික ලකුණක් දෙන්න.

WWW.OLEVELAPI.COM

❖ නියමිත ආකෘතිය අනුගමනය කර නොමැති කල්හි අන්තර්ගතය සඳහා දිය හැකි උපරිමය ලකුණු 03කි.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

# III පත්‍රය

- ❖ උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් උත්තර සපයන්න.
- ❖ 1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් එකකටත් උත්තර සපයන්න.

**මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.**

මේ පත්‍රයේ දී නිර්දිෂ්ට සාහිත්‍ය පාඨ පිළිබඳව අපේක්ෂකයාගේ අවබෝධය හා රසවින්දන හැකියාව ඇගයීමට භාජනය කෙරේ.

**ප්‍රශ්න අංකය 01**

**අපේක්ෂණය** - නිර්දිෂ්ට ග්‍රන්ථ පරිශීලනය පිළිබඳ පරිචය ඇගයීම

**ලකුණු විග්‍රහය** - **මුළු ලකුණු 20යි**

මෙම ප්‍රශ්නයට කෙටි උත්තර අපේක්ෂිත අනුප්‍රශ්න දහයක් ඇතුළත් වේ. එක් අනු ප්‍රශ්නයක එක කොටසකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 20කි.

1. (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නො ලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) (අ) 'ගුත්තිල කාව්‍යය' රචනා කරන ලද්දේ කවර සාහිත්‍ය යුගයේ ද?
(ආ) 'ගුත්තිල කාව්‍යයේ' රචකයා නම් කරන්න.

(ii) (අ) සිංහල ජන ජීවිතය පිළිබඳ ඉංග්‍රීසි භාෂාවෙන් රචිත 'විලේජ් ඉන් ද ජංගල්' කෘතියේ කතුවරයා නම් කරන්න.
(ආ) 'බැද්දේගම' හැර ඒ. පී. ගුණරත්න මහතා විසින් පරිවර්තනය කරන ලද වෙනත් නවකතාවක් නම් කරන්න.

(iii) (අ) 'ගංගාවේ සංගීතය' පැදිපෙළ අයත් වන්නේ කවර යුගයකට ද?
(ආ) 'කුණාටුව', 'එකෝමත් එක රටක', 'සංවාදය' යන කාව්‍ය ග්‍රන්ථවල රචකයා කවරෙක් ද?

(iv) (අ) 'පන්සිය පනස් ජාතක පොත' සඳහා මූලාශ්‍රය කොටගත් ග්‍රන්ථය නම් කරන්න.
(ආ) මහෞෂධ පඬිතුමාගේ බුද්ධි මහිමය ප්‍රකාශ කිරීම සඳහා රචනා කරන ලද ජාතක කථාව කුමක් ද?

(v) (අ) 'සිංහබාහු' නාට්‍යය හැර මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මහතා විසින් රචිත වෙනත් නාට්‍ය **දෙකක්** ලියන්න.
(ආ) මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මහතාගේ ස්වයං ලිඛිත චරිතාපදානය කවර නමකින් හැඳින්වේ ද?

(vi) (අ) 'හංස සන්දේශය', 'ලෝවැඩ සඟරාව', 'කව් ලකුණු මිණිමල' යන ග්‍රන්ථවල කතුවරයා නම් කරන්න.
(ආ) 'හංස සන්දේශය' ලියන ලද සාහිත්‍ය යුගය දක්වන්න.

(vii) (අ) කේ. ජයතිලක මහතා විසින් රචනා කරන ලද කෙටිකතා සංග්‍රහ **දෙකක** නම් ලියන්න.
(ආ) 'දියමන්ති මාලය' කෙටිකතාවේ ප්‍රධාන චරිතය කුමක් ද?

(viii) (අ) දැනට මෙරට හමු වී ඇති පැරණිතම සිංහල කෘතිය කුමක් ද?
(ආ) එම කෘතියේ රචකයා නම් කරන්න.

(ix) පහත සඳහන් කවියේ ඉතිරි පද **දෙක** සම්පූර්ණ කරන්න.
සිය පින් සිරින් සරු
දෙතිස් ලකුණෙන් විසිතුරු
(අ) ........................................
(ආ) ........................................

(x) (අ) 'කව්මිණ', 'කව්මුතු', 'ළමා කව් කලඹ' යන කෘතිවල රචකයා නම් කරන්න.
(ආ) සිනිඳු මොළොක් බව මලෙහි
පිරිසිදු බව පිනි බිඳෙහි
යන පද්‍යය ඇතුළත් කාව්‍ය ග්‍රන්ථය සඳහන් කරන්න.

(ලකුණු 02 × 10 = 20 යි)

01.

(i) (අ) කෝට්ටේ යුගය
(ආ) වෑත්තෑවේ හිමි

(ii) (අ) ලෙනාඩ් වුල්ෆ් / වුල්ෆ්
(ආ) සුදු ගෝනා, වානරයා, වන සරණ, මැකී ගිය දඩමං, වාලම්පුරි

(iii) (අ) කොළඹ යුගය
(ආ) එච්.එම්. කුඩලිගම / කුඩලිගම කවියා



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

(iv) (අ) පාලි ජාතකට්ඨ කථාව / ජාතකට්ඨ කථාව

(ආ) උම්මග්ග ජාතකය / උමංදාව

(v) (අ) මනමේ, වෙස්සන්තර, මහාසාර, පබාවතී, පෙමතො ජායති සොකො, රත්තරන්, එලොව ගිහින් මෙලොව ආවා, ලෝමහංස, කදා වළලු, කිරි මුට්ටිය ගඟේ ගියා, බව කඩතුරාව.

(ආ) පින් ඇති සරසවි වරමක් දෙන්නේ.

(vi) (අ) වීදාගම මෛත්‍රෙය හිමි / මෛත්‍රෙය හිමි / වීදාගම මාහිමි / වීදාගම හිමි /මෛත්‍රෙය මාහිමි

(ආ) කෝට්ටේ යුගය

(vii) (අ) අතීරණය, කටු සහ මල්, එක ගෙයි අවුරුද්ද, වජිර පබ්බත, පුනරුත්පත්තිය හා තවත් කෙටි කතා, නොනිමි සිත්තම හා තවත් කෙටිකතා, දියණිය ආපසු එයි.

(ආ) මැටිල්ඩා / ලොයිසල් මහත්මිය.

(viii) (අ) දම්පියා අටුවා ගැටපදය. (ධම්පියා අටුවා ගැටපදය)

(ආ) දෙබිස වැ ජා අබා සලමෙවන් / අබා සලමෙවන් / පස්වන කාශ්‍යප රජතුමා

(ix) කෙලෙසුන් කෙරෙන් දුරු
වඳිමි මුනි උතුමන් තිලෝගුරු

(x) (අ) ටිබෙට් ජාතික එස්. මහින්ද හිමි / මහින්ද හිමි / එස්. මහින්ද හිමි / සිකීම් මහින්ද හිමි

(ආ) ජාතික තොටිල්ල / දරු නැළවිල්ල හෙවත් ජාතික තොටිල්ල

**ප්‍රශ්න අංකය 02**

**අපේක්ෂණය** - 1. නිර්දිෂ්ට සාහිත්‍ය පාඨ පිළිබඳ අවබෝධය

**ලකුණු විග්‍රහය** - **මුළු ලකුණු 20යි (එක් කොටසකට ලකුණු 04 බැගින්)**

(අ) කොටස ***ලකුණු 02යි***

(ආ) කොටස ***ලකුණු 02යි***

2. පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(i) "ඔව්, එදා ඔයාව හම්බු වෙලා කථා බස් කරලා ගිය දවසෙ ඉඳන් අද වන තුරු මම වින්ද කරදර හිරිහැර අනන්තයි. අප්‍රමාණයි. ඉතින් ඒ ඔක්කෝම මං වින්දෙ ඔයා හින්දා"

(අ) මෙය ප්‍රකාශ කරන ලද්දේ කවුරුන් විසින් කා හට ද?

(ආ) මෙම පාඨය හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් ලියන්න.

(ii) "නැඟී සිටුව! ආචාරිනි, මා නො වඳුව" කියා මහ බෝසතාණන් වහන්සේ බැණ නැඟී හඬ සියලු චතුරංගිනි සේනායෙහි අරගල මැඩ ගෙන සිටියේ ය.

(අ) චතුරංගිනී සේනාව නම් කරන්න.

(ආ) මෙම ප්‍රකාශය හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් ලියන්න.

(iii)
කුළින් කුළම **සිහිල'ඹ** වැහෙන කඳුරැය
දොළින් දොළම කල් යල් කරන කුඹුරැය
පළින් පළම තල් පොල් ගෙ වතු මැඳුරැය
තළින් තළම පුල් පියුමු'පුල **පඬෙරැය**

(අ) තද කළු අකුරෙන් මුද්‍රිත පදවල අර්ථය ලියන්න.

(ආ) මේ කවියෙන් කියැවෙන ප්‍රදේශයේ ස්වභාවය විස්තර කරන්න.

(iv) "ඔහු වියපත් කල්හි මවුපියො ශිල්ප උගන්නට තක්සලා නුවර නගා-යවූහ. හෙ **ධර්මාන්තෙවාසික වැ** ශිල්ප උගන්නි. **වත්සපනැ.** කී කී දැයක් වහා සපයයි, මන වඩන නියායෙන් හැසිරෙයි, පෙම් වඩන නියායෙන් බෙණෙයි."

(අ) තද කළු අකුරෙන් මුද්‍රිත පදවල අර්ථය ලියන්න.

(ආ) සමස්ත පාඨයේ අර්ථය ලිහිල් බසින් ලියන්න.

(v)
ජාතිය රන් විමනක් වේ
ආගම මිණි පහනක් වේ
එය රැක ගන්නට මෙ ලොවේ
සමත් වෙතොත් පුත නුඹ වේ

(අ) ඉහත සඳහන් කවියේ අන්තර්ගත රූපක **දෙකක්** ලියන්න.

(ආ) සමස්ත කවියේ අර්ථය ලිහිල් බසින් ලියන්න.

(ලකුණු 04 × 5 = 20 යි)



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

02.

(i) (අ) මැටිල්ඩා ලොයිසල් විසින් ෆොරොස්ටියර් මැතිනියට.

(ආ) එක්තරා ඉරිදා උදෑසනක මැටිල්ඩාට ෆොරොස්ටියර් මහත්මිය හමු වූ අවස්ථාවේ මැටිල්ඩා ලොයිසල් මහත්මිය විසින් ෆොරොස්ටියර් මහත්මියට කරන ලද ප්‍රකාශයකි.

(ii) (අ) ඇත්, අස්, රිය, පාබල

හස්ති, අශ්ව, රථ, පාබල

(ආ) ධර්ම යුද්ධ අවස්ථාවේ දී මැණික ලබා ගැනීමට කේවට්ට බමුණා බිමට නැමුණු විට මහෞෂධ පඬිතුමා කේවට්ට බමුණාගේ මුහුණ, බිම අතුල්ලමින් කරන ලද ප්‍රකාශයකි.

(iii) (අ) සිහිලඹ - සිහිල් ජලය / සීතල ජලය

සිසිල් දිය / සිසිල් පැන්

පඬෙර - සුදු නෙළුම්

(ආ) කඳු මුදුනක් පාසා සීතල ජලය වෑහෙන දිය පාරවල් තිබීම

යල මහ දෙකන්නය වගා කරන කුඹුරු තිබීම

තල් ගස්, පොල් ගස් සහිත ගෙවතු හා විශාල ගෙවල් තිබීම

නෙළුම්, මානෙල් මල් පිපුණු විල් තිබීම

(iv) (අ) ධර්මාන්තේවාසිකවැ - ධර්මයට අතවැසිව / ගුරුවරයා සමීපයේ ඉඳිමින් / උවටැන් කරමින් ශිල්ප ඉගෙනීම

වත්සපනැ - වත් සම්පන්න / පිළිවෙතින් සම්පූර්ණව

(ආ) ඔහු වයසින් මුහුකුරා ගිය විට දෙමවුපියෝ ශිල්ප ඉගෙනීමට තක්සලා නුවරට යැවූහ. ඔහු ධර්මයට අතවැසි ව ශිල්ප උගනියි. පිළිවෙතින් සම්පූර්ණ ය. කී කී දෙය ඉක්මනින් සපයා දෙයි. සිත් සතුටු කරන ආකාරයට හැසිරෙයි. සිත් ඇදගන්නා ආකාරයෙන් / චිත්තාකර්ෂණීය ලෙස කතා කරයි.

(v) (අ) ජාතිය රන් විමනක්

ආගම මිණි පහනක්

WWW.OLEVELAPI.COM

(ආ) ජාතිය රන් විමානයකි. ආගම මැණික් පහනකි. ආගම හා ජාතිය රැක ගැනීමට ලෝකයෙහි සමතෙක් වේ නම් පුත, ඒ නුඹ වේ.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

**ප්‍රශ්න අංකය 03**

**ප්‍රශ්න අංක 03 - 07 තෙක්**

**අපේක්ෂණය** - ඇගයීම, ප්‍රකාශනය, භාවිත හැකියාව, විචාර හැකියාව හා රසවින්දන හැකියාව ඇගයීමට ලක් කිරීම

**ලකුණු විග්‍රහය** - 3, 4 ප්‍රශ්න අනිවාර්ය යි. - **ලකුණු 15යි**

5, 6, 7 ප්‍රශ්නවලින් එකක් පමණක් තෝරා ගත යුතුයි. - **ලකුණු 10යි**

**3.** (i) උපහාසය හා අනුකම්පාව පෙරදැරිව කෙරෙන චරිත නිරූපණයත්

(ii) උචිත උපමා හා යෙදුම් භාවිතයත්

'උග්ගසේන නම් සිටු පුත්හුගේ වස්තුව' රසවත් වීමට ඉවහල් වී ඇත. එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් විමසන්න.

**නැතහොත්**

(i) අවස්ථෝචිතව චරිත වෙනස් කිරීම

(ii) සරල භාෂා භාවිතය

ගුත්තිල කාව්‍යය රසවත් කාව්‍යයක් වීමට හේතු වී ඇත. නිර්දිෂ්ට කවිවලින් එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් විමසන්න.

(ලකුණු 15 යි)

03. **උපහාසය හා අනුකම්පාව පෙරදැරිව සිදු කෙරෙන චරිත නිරූපණය**

★ උග්ගසේන සිටු පුත්‍රයා තම පරම්පරාව, ධනය, දෙමාපියන් ආදීන් අමතක කොට විද්දත් දියණිය වෙනුවෙන් ජීවිතය කැප කිරීමට තීරණය කිරීම

'ඈ කෙරෙහි බලවත් වූ ප්‍රේම ඇතිව ලදොත් ජීවත් වෙමි. නොලදොත් මියෙමි. සිතා ගෙන නොකා නොබී හැඳට නැගිලා......'

★ විද්දත් දූ උග්ගසේනට තම පුතු නළවන අවස්ථාවේදී දොස් නැගීම

'ගැල් රකිනවුගේ පුත, බර උසුලන්නවුගේ පුත කුමකුත් නො දත්තවුගේ පුතෑ....'

★ උග්ගසේන ගැල් ගමන් නැවැත්වූ අවස්ථාවල ද තමාට තරම් නොවන දේ කිරීම

'ගොන්ට තණ ගෙනවුත් ලති. කෙළි ලළු පෑ ඇවිද තැන ලත් දෙයක් යන එන තැනට අදිති'

★ උග්ගසේන තම බිරිඳ නින්දා කරන්නේ කාටදැයි විමසන අවස්ථාවේ බිරිඳගේ ප්‍රකාශය.

'එසේය අනෙක් කාට කියම් ද? තොප ම කොට ඇවිදිනා කටයුතු හෙයින් තොප ම අරභයා කියම්'

★ උග්ගසේන තමාට තවදුරටත් නින්දා කරයි නම් ඈ අතහැර පලා යන බව කියන විට ඇය

'තොප ගිය මැන, හුන මැනව. තොප කුමකුත් නොදන්නා තැනැත්තවුන්ගෙන් මට කම් කිම්දැ'?

★ උග්ගසේන උගත් ශිල්පය සිය නගරවාසීන්ට පෙන්වන අවස්ථාවේ සියල්ලන් එදෙස නොබලා බුදුන් දෙස බලා සිටින අවස්ථාව.

'බුදුන් අවුත් මෙතැනට සම්භව ඔබ ම අමුතුව පහළ වූවා සේ බලන බව මුත් මෙනුවරට මා ආදියෙන් පානා කෙළි බලන්නෝ නැත. පැසුණු ගොයම් මුල්වූවා සේ දුක් ගෙන.......'

ආදී නිදසුන් ඉදිරිපත් කොට විස්තර කළ යුතු ය.

(ii) **උචිත උපමා හා යෙදුම්**

පැසුණු ගොයම් මුල් වූවා සේ දුක් ගෙන...

★ කර'ග රහත් වන්නා සේ

අවකප්පනයෙන් සැදූ හසු රෑන අල්වා ඇදි ඇදි සේ දුවන්නා සේම

ම දුව විකුණන්නා නැත රන් හැරගෙන නො දෙමි



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

අප හා එක්වන්නා ම දුව පාවා දෙමි.

'එසේ වී නම් විද්දෑ උන් හා එක්වෙමි. දුවගේ හාවභාව ලීලා දැක ඩියෝධාත්වාධික රූප කලාප විකාරයන් බලවත් නියාය.'

ආදි උපමා හා යෙදුම් කතාව රසවත් වීමට යොදා ගෙන ඇති ආකාරය විස්තර කර තිබිය යුතු ය.

නැතහොත්

(i) අවස්ථෝචිතව විරිත් වෙනස් කිරීම.

1. සරල විරිතක්     * විරිත් නම් කිරීම අවශ්‍ය නැත.

"ගුත්තිල ඇදුරු සඳ...."

"දෙදෙනම ඉඳ දෙපිට....."

★ රස ජනනය වන පරිදි අවස්ථෝචිතව විරිත් යොදා ගෙන ඇත.

★ "කන්කලු වෙණ නද ඇසුමෙහි ලොබිනේ....."

"අසන රිසින් නයි කැල ඔසලෝයා......"

★ "දිය දිය ගොස පළ කෙරෙමින් සපැමිණි......."

"මන් මත් කරවන දන මුළු දෙරණා......"

★ "රූ රැසේ අඳිනා ලෙසේ අත් ලෙල දිදී විදුලිය පබා......"

"පුන් මදාරා මල් දමින් මුදු දිගු සුනිල් වරලස ගොතා......"

★ මහ පියුම් විරිත

පෙද විරිත

විසිහයමත් විරිත ආදි විරිත් සඳහන් කරමින් ඊට අදාළව නිදසුන් දක්වා ඇතොත් සම්පූර්ණ ලකුණු පිරිනමන්න.

මෙහිදී විරිත් නම්කොට නොතිබුණ ද යෝග්‍ය පරිදි විරිත් භාවිත කළ බව නිදසුන්වලින් තහවුරු කර ඇත්නම් සම්පූර්ණ ලකුණු පිරිනමන්න.

(ii) සරල භාෂාව

උදා.- 1. ගුත්තිල ඇදුරු සඳ..........'

7. අප බෝසතුන් මිස ........'

13. දෙවැනි තුන් වැනි තත......'

18. මන මත් කරවන දන මුළු දෙරණා.....'

මේ සඳහා අදාළ කර ගත හැකි වෙනත් නිදසුන් ද (නියමිත කොටසින්) ලියා ඇති කල්හි සම්පූර්ණ ලකුණු දෙන්න.

WWW.OLEVELAPI.COM

**4.** (i) සිලිඳුගේ චරිතයත්

(ii) පුංචිමැණිකාගේ චරිතයත්

බැද්දේගම නවකතාව තුළ නිරූපණය කර ඇති ආකාරය නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් සාකච්ඡා කරන්න.

**නැතහොත්**

(i) අපූර්ව කාව්‍යෝක්ති භාවිතයත්

(ii) පරිසරයේ ස්වාභාවික සිද්ධි සජීවීව ඉදිරිපත් කිරීමත්

'වස්සානය' කවිපෙළ රසවත් නිර්මාණයක් බවට පත් වීමට හේතු වී ඇත. එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් සාකච්ඡා කරන්න.

(ලකුණු 15 යි)



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

04.

(i) **සිලිඳුගේ චරිතය නිරූපණය කර ඇති ආකාරය:-**

★ සිලිඳුගේ අණට කීකරුව පුළුවන් උපක්‍රමයකින් ඔවුන් ආපසු එනතුරු කරලිනා හාමිත් සමග ගෙදර බලා සිටිනවා විනා පුංචි මැණිකා විසින් කළ හැකි අන් කිසිවක් නොවී ය.

- සිලිඳුගේ අණට දරුවන් කීකරු බව
- සිලිඳු දරුවන්ට ආදරය කළ බව මින් කියැ වේ.

★ • දරුවන්ට කතා කියා දීම

- පරිසරය හඳුන්වා දීම
- පරිසරයට ආදරය කරන බව

'කුඩා කල සිලිඳු කී වනයෙහි මංමුලා වූ දඩයක්කාරයින්ගේ කතා ඇට සිහි විය.' යන්න තුළින් මතු වේ.

★ • සිලිඳු දඩයක්කරුවෙකු බව

- කොටියෙකු මෙන් රළු නපුරු මිනිසෙකු බව
- 'පිස්සු වැද්දා කොටියෙකැයි කියන්නට පුරුදු වී සිටි ගම්මුන් පුංචි මැණිකා ගැන කීවේ කොටියාගේ පැටියා මුවෙක් වෙලා කියාය.' කියමනෙන් පැහැදිලි වේ

★ • අදූරදර්ශී බව

- සමාජය ගැන ඇති අනවබෝධය පහත කියමනෙන් සනාථ වේ
  'සිලිඳු කීවාක් මෙන් බබුන්ගේ පැමිණීමෙන් පසු සියලුම කරදර ඉවර වී ඔක්කොම හොඳ වෙයි යන බලාපොරොත්තුව ඇතිව ය.'

(ii) **පුංචි මැණිකාගේ චරිතය නිරූපණය කර ඇති ආකාරය:-**

★ අභියෝග (දුෂ්කරතාවලට) මුහුණ දීමේ හැකියාව

★ ඉවසීම

★ අධිෂ්ඨානශීලි බව

★ නොපසුබස්නා උත්සාහය

★ තම පියා හා ස්වාමියා කෙරෙහි දක්වන දැඩි ආදරය

**අභියෝග**

WWW.OLEVELAPI.COM

★ පුංචි මැණිකාගේ හද දෙදරුම් කෑවේ ය. ඈ තමාගේ ලොකු ඇස් දෙක වෙදරාලගේ මුහුණට හෙළුෑ ගමන් නො සැලී සිටියා ය.

★ හිරපල්ලා තම කතාවෙන් බලාපොරොත්තු වූයේ හිස අත්බදාගෙන කෑ ගසන ගැහැනියකගේ විලාපයකි. එහෙත් පුංචි මැණිකා නිශ්ශබ්දව ම එතැනින් ගොස් නැවතත් බිත්තිය අද්දර ඇන තියා ගැනීම.

★ එයා මැරිලා සීයේ......, මං යනවා.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**අධිෂ්ඨානශීලීභාවය**

★ පුංචි මැණිකා නිශ්ශබ්දව ම වෙදරාලගේ ගෙයින් සෙමින් දොරට බැස ගෙදර ගියා ය. සිර ගෙදරට ගොස් ඔවුන් ගැන විමසන්නට ඈ සිතා ගත්තා ය.

★ මට බොහොම මහන්සියි සීයේ මං බොහොම කරදර විඳගෙන ආවේ. එයා සොයන්න.

★ ඒත් හිර ගෙදරින් අහන්ඩ ඕනෑ. ඉස්සර වෙලා මගේ මිනිහා ගැන.

**ස්වාමි භක්තිය/ පිය සෙනෙහස**

★ බබුන් සිර ගෙට නියම වීමත්, ඇගේ පියා ඈට නැති වීමත්, පියාගේ ඉරණම පිළිබඳව ඇගේ සිතේ පැවති බියත් නිතර ඇගේ දුක හා දොම්නස ද දියුණු කළේ ය.

★ පුංචි මැණිකා දවස පටන්ගන්නට පුරුදු වූයේ අද බබුන් ගෙදර එයි යන බලාපොරොත්තුවෙනි.

★ මහල්ලාගේ කතාවෙන් උපන් සන්තාපයත් දුකත් එකතු විය. ඈ නිසොල්මනේ වැලපෙන්නට වූවා ය.

★ 'කොහොම ද මම එයාගෙ නම කියන්නේ අයියා?'

★ 'එයාට මොකද වුණේ? දවස් ගණනක් තිස්සේ මං මෙහාට ආවේ මේක දැන ගන්ඩ'.....

නැතහොත්

(ii) ★ **අපූර්ව කාව්‍යෝක්ති භාවිතය:-**

"ඔය දෑල දොඩමලුය සුවඳ බැරුවා ඉන්ට"

"කෙකටියා පඳුර සුදු මල් පොකුර වඩාගෙන"

"කුඹුක් අතු වතුර අත ගගා නැමිලා දියට"

"හුලංදා ඔය කිමිද මල්වරව ඉල්මහට"

"සෙනේහය පිරී ගිය ඔබේ නයන නිල් පොකුණ"

"කටු පොකුර සිප ගනිමි හෙට මලක් වනු පිණිස"

ආදි නිදසුන් මඟින් ලියා තිබිය යුතුය

* එකම උදාහරණය දෙතැන්හට තිබුණොත් ලකුණු දෙන්න.

★ **පරිසරයේ ස්වාභාවික සිද්ධි සජීවීව ඉදිරිපත් කිරීම:-**

"ඔය දෑල දොඩමලුය සුවඳ බැරුවා ඉන්ට

"කුඹුක් අතු වතුර අතගගා නැමිලා දියට

වැහි වලාකුළු රංචු කඳු මුදුන්වල ලගින

රමණීය වන ගැබෙහි මොනරුන්ට පිල් වියන

සන්නාලියන් කොහොම ඇන්දාද දේදුන්න

ගිම්හානයේ ගිලන් වී කෘශව සුදුමැලිව ඇදී ඇදී ඉකි ගැසූ ගඟ නැවත පිරිපුන්ය.

ආදි නිදසුන් මගින් පරිසරයේ ස්වාභාවික සිද්ධි සජීවීව ඉදිරිපත් කර ඇති බව තහවුරු වී ඇත්නම් සම්පූර්ණ ලකුණු පිරිනමන්න.

***(උදාහරණ සඳහා ලකුණු 04යි. සමස්ත විස්තරයට ලකුණු 11යි. මුළු ලකුණු 15යි.)***

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

- **5, 6, 7 ප්‍රශ්නවලින් එකකට පමණක් උත්තර ලියන්න.**

**5.** සමාජයට අවැඩ සිදු කරන්නන් නිසා මිනිසුන්ගේ ජන ජීවිතය අඩාළ කරන ආකාරය 'අඟුල්මල් දමනය' ඇසුරෙන් උදාහරණ **තුනක්වත්** දක්වමින් විමසන්න. (ලකුණු 10 යි)

★ **ජන ජීවිතය අඩාළ කරන ආකාරය**

1. මිනිසුන් තමන් ජීවත් වූ **ගම්බිම්** අතහැර ආරක්ෂිත ස්ථාන කරා ගමන් කිරීම

   "එකල්හි ගම් **වැස්සො ගම්** පියා ගොස් නියම් ගම් වන්හා. නියම් ගම්වැස්සො ගොස් නුවර වන්හු. තුන් **යොජනක් තන්හි** මිනිස්හු ගෙ පියා දරුවන් අතැ ගෙනැ ගොස්......

2. මිනිසුන්ට **සිය දෛනික** කටයුතු කරගැනීමට නොහැකි වීම

   "හෙ **හැම අරණ්‍යයෙහි** හසර නැති කෙළෙ. දර පලා සඳහා වල් යන්නාහු නැති....."

   "රෑ **ගමට වැද** පයින් පැහැර දොර ගලවා පියා එහි හොතුවන් මරාපියා......"

★ **රාජ්‍ය පාලනයට බාධා**

"මිනිස්සු **ගෙපියා** දරුවන් අතැ ගෙනැ ගොස් සැවැත් නුවර වටා කඳවුරු බැඳැ **රාජාඞ්ගණයෙහි** රැස් වැ....."

"**මහරජ** තොපගේ රට අඟුල්මල් නම් සොරෙකැ දරුණැ. ලෙමුඩු අත් ඇත්තේ යැ. ගම් නොගම් **කෙළෙ.** නියම් ගම් නොනියම්ගම් කෙළෙ....."

ආදී නිදසුන් මඟින් පිළිතුර ලියා ඇත්නම් සම්පූර්ණ ලකුණු දෙන්න.

***(උදාහරණ සඳහා ලකුණු 03යි. සමස්ත විස්තරයට ලකුණු 07යි. මුළු ලකුණු 10යි.)***

**6.** "පැරණි ගැමි සමාජයේ මිනිසුන්ගේ ආකල්ප හා සිතුම් පැතුම් වෙනස් කිරීමේ අභියෝගය 'අපට වැසිකිළියක්' කෙටි කතාවෙන් නිරූපණය වේ." උදාහරණ **තුනක්වත්** දක්වමින් සාකච්ඡා කරන්න. (ලකුණු 10 යි)

★ මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමා පැමිණ සුමාන දෙකක් ඇතුළත වැසිකිළියක් සෑදිය යුතු බව ප්‍රකාශ කරන අවස්ථාව

"සුමාන දෙකක් ඇතුළත වැසිකිළියක් හදන්න ඕනෑ. මම ආයිමත් සුමාන දෙකකට පස්සේ එනවා. එතකොට වැසිකිළියක් හදල නොතිබුණොත් නඩු දානවා. එහෙම කළොත් උසාවි ගිහින් දඩ කන්න වේවි"

★ වැසිකිළියක් පාවිච්චි කිරීමට හේරත් තුළ වූ අකමැත්ත ප්‍රකාශ කිරීම

"නීතියෙන් බේරෙන්ඩ හැදුවයි කියමු ගෙයක් ඇතුළ ඉඳ ගෙනත් ඔය වැඩේ කළ හැකි ද? කාට පුළුවන් උණත් මට නම් බෑ"

WWW.OLEVELAPI.COM

★ හැම දෙනා ම වැසිකිළි හදන නිසා තමන් ද සාදන බව හේරත් ප්‍රකාශ කිරීම

"හැම දෙනා ම ලෑලි දමන හින්දා දැම්ම මිසක වළක් ඕනැයි කියල මට නම් කල්පනාවක්වත් උණේ නෑ"

★ තාත්තා පෙර පිරිදි ම කැලයට යෑම

"තවත් කාලයක් තිස්සේ පෙර සිරිත අනුගමනය කළේ තාත්තා පමණි"

★ තාත්තා වත්ත පහළ දිය පාර වෙත යෑම

"දැන් එය තාත්තාට වුවද ප්‍රයෝජන ගැනීමට අසීරු නොවන ස්ථානයක් වී ඇත. එහෙයින් ඔහු එහි යන නමුත් පැරණි ඇබ්බැහිකම්වල නෂ්ටාවශේෂයක් හැටියට ඉන් අනතුරුව වත්ත පහළ දිය පාර වෙත යයි"

***(උදාහරණ සඳහා ලකුණු 03යි. සමස්ත විස්තරයට ලකුණු 07යි. මුළු ලකුණු 10යි.)***



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**7.** ශ්‍රාවක සිත් තුළ සමෘද්ධිමත් රටක් සඳහා ශ්‍රමදායකත්වයේ වටිනාකම ජනිත කරවීමට 'දෑතේ කරගැට සිඹ සනසන්නට' ගීතය සමත් වී ඇති ආකාරය උදාහරණ **තුනක්වත්** දක්වමින් විස්තර කරන්න. (ලකුණු 10 යි)

07. සමෘද්ධිමත් රටක් සඳහා ශ්‍රමදායකත්වයේ වටිනාකම ජනිත කරවීමට

i. දෑතේ කරගැට සිඹ සනසන්නට

ළා ගොයමේ දලු පවන් සලයි

දහදිය මුතු ඇට මල් වරුසා වී

කරල් බරින් පීදී වැගිරෙයි

මහන්සි වී වැඩ කරගන්නන්ට සොබාදහම පවා සතුට, සැනසීම ලබා දෙන බව කවියා අපූර්වත්වයෙන් කියාපායි.

ii. දහසක් වැව් බැඳි යෝධ මිනිස් කැල

යළි ඉපදී ඇති මවු දෙරණේ

සත් රුවනින් නව නිදහන් මතු වී

පුතුගෙ සිනාවෙනි ඔබ් වැටුණේ

අතීතයේ අපේ මුතුන් මිත්තෝ මහන්සි වී තම බාල පරම්පරාව වෙත බොහෝ දේ දායාද කළහ. වර්තමානය ගොඩ නැගී ඇත්තේ ඒ අතීත යෝධ මිනිසුන්ගේ ශ්‍රම දායකත්වයෙනි.

iii. මා ගත වෙහෙසට ආදරයෙන් දිය

උල්පත පාදන පුංචි පුතුන්

ඒ ගත වෙහෙස ම සතුටක් වෙයි මට

ඔබ සිහිවන විට පුංචි පුතුන්

මහන්සි වී වැඩ කිරීමෙන් රටේ ඇතිවන සංවර්ධනය බාල පරපුර වෙත දායාද කිරීම සතුටකි.

මේ නිදසුන් මගින් රටේ සමෘද්ධිය සඳහා ශ්‍රම දායකත්වයේ වටිනාකම කාව්‍යෝපක්‍රම භාවිත කරමින් ඉදිරිපත් කර ඇති ආකාරය විස්තර කර තිබිය යුතුය.

***(උදාහරණ සඳහා ලකුණු 03යි. සමස්ත විස්තරයට ලකුණු 07යි. මුළු ලකුණු 10යි.)***

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....